# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2026.06.15 |


**පැමිණිලිකාර පාර්ශවය** : ආර්. පතිරණගේ මිය,
පැලිගලහේන, රබර් කොරටුව, තෙලිජ්ජවිල.

**වින්දිත පාර්ශය** : ඩබ්ලිව්. ඩී. දිල්ෂාන් මධුසංක මයා,
පැලිගලහේන, රබර් කොරටුව, තෙලිජ්ජවිල

**වගඋත්තරකාර පාර්ශවය** :

1. පොලිස් පරීක්ෂක නුවන් බුද්ධික විජේතුංග මයා
   පොලිස් ස්ථානය, මාතර
2. පොලිස් පරීක්ෂක සමන්ත විජේසේකර මයා
   පොලිස් ස්ථානය, මාලිම්බඩ
3. ප්‍රධාන පොලිස් පරීක්ෂක චන්ද්‍රා ජයවික්‍රම මයා,
   පොලිස් ස්ථානය, මාලිම්බඩ
4. ස්ථානාධිපති
   පොලිස් ස්ථානය, මාතර
5. පොලිස් අධිකාරී එච්. කේ. එස්. විජයගුණවර්ධන මයා,
   පොලිස් අධිකාරී කාර්යාලය, මාතර දිස්ත්‍රික් (1)

**පැමිණිලි අංකය : HRC/MT/245/20/N**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම**

ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය විසින් 2020.08.27 දිනැතිව පැමිණිල්ලක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත භාරදී ඇති අතර, එකී පැමිණිල්ල විධිමත් ආකාරයෙන් ඉදිරිපත් කර නොතිබූ බැවින් නැවත පැමිණිල්ල යොමුකරන මෙන් කොමිෂන් සභාව විසින් උපදෙස් ලබාදී ඇත. එකී උපදෙස් අනුව පැමිණිල්ල යොමුකර නොතිබූ බැවින් කොමිෂන් සභාව විසින් 2020.10.15 දිනැති ලිපිය මගින් පැමිණිලිකාරිය වෙත ලිඛිත දැනුම්දීමක් සිදුකරමින් 2020.10.23 දිනට පෙර පැමිණිල්ලක් යොමුකරන ලෙස දැනුම්දී ඇත. ඒ අනුව 2020.10.21 දිනැතිව විධිමත් ලෙස සකස් කරන ලද පැමිණිල්ලක් පැමිණිලිකාරිය විසින් යොමුකර ඇත. එම පැමිණිල්ල පහත පරිදි වේ. තමාගේ පුතාවන දිල්ෂාන් මධුෂංක යන අය තෙලිජ්ජවිල මංසංධියේ ජංගම දුරකථන අලෙවිසැලක් පවත්වාගෙන යන බවත්, 2020.08.24 වන දින පුත්‍රයා ව්‍යාපාරික ස්ථානයේ සිටියදී මාලිම්බඩ පොලිසියේ නිලධාරියෙකු විසින් දුරකථන ඇමතුමක් ලබාදී පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස දැනුම්දී තිබූ බවත්, එකී දැනුම්දීම අනුව


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04.<br>இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04.<br>No. 14, R. A. De Mel Mawatha, Colombo 04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011 - 250 5451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 - 250 5541/74 |
| ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrcsl@gmail.com | | | | |
| දුරකථනය<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011 - 250 5521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |
| වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk | | | | |

මෝටර් සයිකලයකින් මාලිම්ඩබ පොලිස් ස්ථානය වෙත ගමන් කරමින් සිටියදී, මාලිම්බඩ සුරාසැල අසල රැදී සිටි විජේසේකර නම් පොලිස් නිලධාරියා විසින් පුත්‍රයා ගමන් කරමින් සිටි යතුරු පැදිය නවතා පුත්‍රයාට අමානුෂික ලෙස පහරදී පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇති බවත්, තමා මෙම සිදුවීම පිළිබඳව කිසිවක් නොදැන තම පුත්‍රයා දිවා ආහාරය සඳහා නිවසට පැමිණීම ප්‍රමාද වූ බැවින් පුත්‍රයාගේ දුරකථනයට ඇමතුම් ලබාදුන් බවත් ඊට ප්‍රතිචාර ලබානොදුන් බවත් ප්‍රකාශ කර ඇත. එදින සවස 05.00 පමණ අසල්වැසි කාන්තාවක් තම පුත්‍රයාගේ ව්‍යාපාර ස්ථානය වෙත ගොස් එමින් සිටියදී තෙලිජ්ජවිල මංසන්ධියේ සිටි පුද්ගලයින් ගෙන ලද තොරතුරකට අනුව තම පුත්‍රයා මාලිම්බඩ පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් ඇති බවත් එසේ රැගෙන යාමේදී අමානුෂික ලෙස පහරදී ඇති බවත් තමා වෙත දැනුම්දුන් බව පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම තම දියණියට පැවසූ බවත් ඒ පිළිබඳව සොයාබැලීම සඳහා දියණිය මාලිම්බඩ පොලිස් ස්ථානයට ගොස් ස්ථානාධිපති ජයවික්‍රම මහතා හමුවී ඇති බවත්, එම නිලධාරියා විසින් "තමුසෙගෙ මල්ලි මෙහෙ නැහැ, ඉන්න තැනකින් සොයාගන්නවා" යනුවෙන් ප්‍රකාශ කළ බවත්, දියණිය නැවත පොලිස් ස්ථානයෙන් පැමිණෙන විට තම පුත්‍රයාගේ සෙරෙප්පු යුගල සහ යතුරු පැදිය පොලිස් ස්ථානයේ තිබූ බවට දැක ඇති බවත් ප්‍රකාශ කර ඇත. පසුව 2020.08.24 සහ 25 යන දෙදින දියණිය සහ පුත්‍රයාගේ මිතුරෙකු මාලිම්බඩ පොලිස් ස්ථානයට ගොස් ඇති බවත් එසේ ගොස් ඇති කිසිදු අවස්ථාවක තම පුත්‍රයා පෙන්වා නොමැති බවත් 2020.08.25 වන දින රාත්‍රී 8.30 පමණ තම පුත්‍රයාගේ මිතුරන් දෙදෙනෙකු කෑම පාර්සලයක් ද රැගෙන පොලිස් ස්ථානයට ගිය බවත් එම මිතුරන් දෙදෙනා පිළිබඳව රාත්‍රී 12.00 පමණ වන තෙක් තොරතුරක් නොලැබුණු බැවින් තමා මාලිම්බඩ පොලිස් ස්ථානයට ඇමතුමක් ලබාදී තොරතුරු විමසීමේදී එම මිතුරන් දෙදෙනා ද අත්අඩංගුවට ගත් බවට පොලිස් නිලධාරීන් විසින් තමාට දැනුම්දුන් බවට පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත. 2020.08.26 වන දින තම පුත්‍රයා මාතර පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇති බව දැනගත් පසු තම දියණියන් දෙදෙනා මාතර පොලිස් ස්ථානය වෙත ද, තමා මාලිම්බඩ පොලිස් ස්ථානය විසින් අත්අඩංගුවට ගත් පුත්‍රයාගේ මිතුරන් දෙදෙනා බැලීමට ද ගිය බව ප්‍රකාශ කර ඇත. එහිදී මාලිම්බඩ පොලිස් ස්ථානයේදී අපරාධ අංශයේ ස්ථානාධිපති විජේසේකර මහතා විසින් තමාට අශිෂ්ට අසභ්‍ය වචන වලින් බැනවැදී පොලිස් ස්ථානයෙන් එලවා දැමූ බවත් ඉන් පසු තමා මාතර පොලිස් ස්ථානය වෙත ගිය බවත් ප්‍රකාශ කර ඇත. මාතර පොලිස් ස්ථානයේ නිලධාරීන් තමාට සහ දියණියන් දෙදෙනාට පුත්‍රයා බැලීමට අවස්ථාව සලසාදුන් බවත්, එම අවස්ථාවේදී තම පුත්‍රයා විසින් මෙපමණ දවසක් මාලිම්බඩ පොලිස් ස්ථානයේ තබාගෙන අමානුෂික ලෙස පහරදුන් බවත්, එකී පහරදීම හේතුවෙන් අතේ ආබාධයක් ඇතිවී ඇති බවත් අද දින ද නැවත රැගෙන ගොස් පහරදිය හැකි බව තමාට ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. 2020.08.27 වන දින උදෑසන මාතර පොලිස් ස්ථානය වෙත තම පුත්‍රයා බැලීම සඳහා තමාත් තම දියණියන් දෙදෙනා සහ පුත්‍රයාගේ මිතුරන් කිහිප දෙනෙක් සමග ගිය බවත්, එම අවස්ථාවේදී තම පුත්‍රයාට අමානුෂික ආකාරයෙන් පහරදී පොලිස් ස්ථානයේ පිටුපස සිට ඇවිද ගැනීමට ද නොහැකිව එක් නිලධාරියෙකුගේ ආධාරයෙන්

පොලිස් ස්ථානයේ අපරාධ අංශය තුළට රැගෙන එනු තමන් ඇතුළු සියලුම දෙනා දුටු බව ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී තම දියණිය අපරාධ අංශයේ ස්ථානාධිපති විජේතුංග මහතාගෙන් කිසිදු වරදක් නොකළ තම සහෝදරයාට පහරදීමට හේතුව සහ අත්අඩංගුවට ගැනීමට ඇති සාක්ෂි මොනවාද යන්න විමසූ බවත්, එවිට එම නිලධාරියා විසින් 2020.08.23 දින රාත්‍රියේ තෙලිජ්ජවිල සුරාසැල තුළ සිදුවූ මංකොල්ලයට අදාළ වීඩියෝ දර්ශන පෙන්වමින් එම මංකොල්ලය සිදුකරන පුද්ගලයාගේ හැඩරුව තම පුත්‍රයාට සමාන බව කියූ බවත්, එහිදී එම සැකකරු බාටා පාවහන් යුවළක් පැළඳ සිටිනු දැක තම පුත්‍රයාට බාටා පාවහන් පැළඳිය නොහැකි බවත්, ඊට හේතුව බාටා පාවහන් පැළඳුව පසු සමේ රෝගයක් හට ගන්නා බවත් තමා ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. එම වීඩියෝ දර්ශන නරඹමින් සිටියදී, මාලිම්බඩ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ විජේසේකර නිලධාරියා තම පුත්‍රයාගේ හෙල්මටය රැගෙන පැමිණි බවත්, එය දුටු පුත්‍රයාගේ මිතුරන් විසින් වීඩියෝ දර්ශන වල සිටින සැකකරුගේ හෙල්මටය සහ තම පුත්‍රයා පළඳින හෙල්මට සම්පූර්ණයෙන්ම වෙනස් බවට කරුණු පැහැදිලි කළ බවත්, සියලුම කරුණු වලට සාවධානව ඇහුන්කන්දුන් මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ විජේතුංග මහතා “සිවිල් මිනිස්සුන්ට වැටහුණු මේ ඇත්ත අපට තේරුණේ පරක්කු වෙලා, තව පැයකට කලින් මේ දේවල් ගෙනත් දුන්නා නම් මේ කොල්ලා නිරපරාදේ ගුටි කන්නේ නැහැ” යනුවෙන් ප්‍රකාශ කරමින් “මේක මගෙ අත්වැරදීමක්, මට සමාවෙන්න, මම පුතාගෙ හැම වගකීමක් ම භාර ගන්නම්” යනුවෙන් ප්‍රකාශ කළ බවට පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත. තවද මෙම සිදුවීම වන ස්ථානයේ තම පුත්‍රයා සිටි බවත්, ඒවන විටත් තම පුත්‍රයාගේ අත පය ඉදිමී, මුළු ඇඟම තැලී කකුල තුවාලවී රුධිරය ගලමින් ඉතා අසාධ්‍ය තත්ත්වයේ සිටි බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. නැවත 2020.08.28 වන දින මාතර පොලිස් ස්ථානයට ගිය බවත් එහිදී පුත්‍රයාගේ අත පයේ තුවාල සඳහා පොලිස් නිලධාරීන් විසින් බෙහෙත් දමා තිබූ බවත් එදින ද පුත්‍රයා නිදහස් නොකළ බැවින් 2020.08.29 දින ද පොලිස් ස්ථානයට ගිය බව ප්‍රකාශ කර ඇත. එදින සවස් වන තෙක් පොලිස් ස්ථානයේ රැඳී සිටිය පසු විජේතුංග නිලධාරියා විසින් තමාට නිවසට යන ලෙසත් පුත්‍රයා වාහනයකින් රැගෙන පැමිණෙන බවට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. එදිනම විජේතුංග නිලධාරියා විසින් වාහනයකින් තම පුත්‍රයා නිවසට රැගෙන පැමිණි බවත් එසේ පැමිණෙන විට පුත්‍රයාගේ පාදවල ඉදිමීම වසන් කිරීම සඳහා අලුත් සපත්තු යුවළක් ද ලබාදී බලහත්කාරයෙන්ම ඒවා පළඳවා ගෙන පැමිණි බවත්, නිවසට පැමිණි පසු තමාගෙන් සිදුවූ වරදට සමාව අයැද සිටි බවත්, වෙළඳසැලේ මාසික කුලිය සහ පුත්‍රයාගේ ප්‍රතිකාර සඳහා වැය වන වියදම් සම්පූර්ණයෙන් එම නිලධාරියා බලාගන්නා බවට ප්‍රකාශ කර පිටත්ව ගිය බවත් සඳහන් කර ඇත. ඉන් පසු දින දෙකෙන් දෙකට මාතර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වාහන වලින් මාතර සමූපකාර රෝහල වෙත රැගෙන ගොස් ප්‍රතිකාර ලබාදීම සිදු කළ බවත්, එහෙත් පුත්රයාගේ පාදවල ඉදිමීම අඩු නොවූ බැවින් එක්ස්රේ පරීක්ෂාවක් කළ යුතු බවට ඉල්ලා සිටි පසු 2020.09.14 දින සමූපකාර රෝහල වෙත නැවත රැගෙන ගොස් එක්ස්රේ පරීක්ෂාවක් සිදු කළ බවත් එහිදී පාද දෙකේම අස්ථි කැඩී ඇති බවට සඳහන් වූ බැවින් පොලිස්

නිලධාරීන් විසින් තම පුත්‍රයා 2020.09.16 වන දින මාතර මූලික රෝහල වෙත රැගෙන ගිය බවත්, එහිදී පොලිස් නිලධාරීන් විසින් මාතර රෝහල වෙත ප්‍රකාශ කර ඇත්තේ තම පුත්‍රයා සති දෙකකට පෙර තාප්පයකින් වැටීම හේතුවෙන් මෙම අනතුර සිදුවී ඇති බවයි. එදින පාද වලට බැන්ඩේජ් දමා රෝහලෙන් පිටත් කර යැවූ බවත්, පැමිණෙන විට මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේතුංග මහතා විසින් තම පුත්‍රයාට කිහිලිකරු දෙකක් මිලදීගෙන දුන් බවත් ප්‍රකාශ කර ඇත. නැවත 2020.10.07 දින කකුල් වලට දමා තිබූ බැන්ඩේජ් ඉවත් කිරීම සිදු කළ බවත්, එදිනෙන් පසු පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේතුංග මහතා තම පුත්‍රයා පිළිබඳව කිසිදු සොයාබැලීමක් සිදු නොකළ බවත්, බැන්ඩේජ් ඉවත් කළ ද පාද වල වේදනාව දිනෙන් දින වැඩි වූ බැවින් 2020.10.15 නැවත මාතර රෝහල වෙත පුත්‍රය ඇතුළත් කළ බවත් ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, තම පුත්‍රයා අත්අඩංගුවේ සිටින කාලය තුළදී සහ ප්‍රතිකාර ලබමින් සිටින කාලය තුළදී සහකාර පොලිස් අධිකාරී කාර්යාලය වෙත ද, මාතර, නුපෙ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙත ගිය බවත්, එකී සෑම අවස්ථාවකදීම ඔවුන් විසින් තමාට මෙම පැමිණිල්ල දුරදිග රැගෙන නොයන ලෙසත්, තම පුත්‍රයා නිදහස් කිරීම සිදුකර ඇත්තේ මෙම ප්‍රශ්නය දුරදිග රැගෙන නොයන බවට වූ විශ්වාසය මත බවට ප්‍රකාශ කළ බව පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. එහෙත් තම පුත්‍රයාට මාලිම්බඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් හා මාතර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත් පා බැඳ, දෙඇස් බැඳ, එඬේර මිරිස් ශරීරය පුරා තවරා අමානුෂික ලෙස පහර දෙමින් මරණීය තුවාල සිදුකරමින් නිවැසියන්ට කිසිදු දැනුම්දීමක් සිදුනොකර දින ගණනක් සගවා තබා ගනිමින් සිදු කළ අපරාධයට නිසි විමර්ශනයක් සිදුකර සාධාරණයක් ඉටු කරදෙන ලෙසට මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත.

<u>වින්දිත පාර්ශවයේ කරුණු දැක්වීම</u>

වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුශංක යන අය විසින් 2021.02.02 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් පහත පරිදි කරුණු ඉදිරිපත් කර ඇත. තමා 2020.08.24 දින දහවල් තමාගේ ත්‍රීස්ටර් නැමති ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරික ස්ථානයේ සිටින විට, තමාගේ මිතුරෙකු වන මුදිත යන අය විසින් තමාට දුරකථන ඇමතුමක් ලබාදී තමාට තෙලිජ්ජවිල වයින් ස්ටෝස් එක අසලට පැමිණෙන ලෙස පොලිසිය විසින් දැනුම්දුන් බවට මුදිත ප්‍රකාශ කළ බවත්, ඒ අනුව තමා තම මිතුරා වන ජනිත් යන අය ව්‍යාපාරික ස්ථානයේ නතර කර, මිතුරෙකුගේ යතුරු පැදියෙන් එම ස්ථානයට ගිය බවත් ප්‍රකාශ කර ඇත. එම ස්ථානයට ගිය පසු එම ස්ථානයේ සිටි පොලිස් නිලධාරීන් වයින් ස්ටෝස් එක තුළ තිබූ කාමරයක් තුළට තමා රැගෙන ගොස් මාලිම්බඩ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේසේකර මහතා තමාට අතින් පයින් අමානුෂික ආකාරයෙන් පහරදෙමින් වයිස් ස්ටෝස් එකෙන් සොරකම් කරන ලද මුදල් පිළිබඳව විමසූ බවත්, තමා ඒ පිළිබඳව නොදන්නා බව ප්‍රකාශ කළ ද සොරකම

සිදුවූ දින වීඩියෝ දර්ශනවල සිටින පුද්ගලයා තමා බවට තර්ජනය කරමින් පහරදී මාලිම්බඩ පොලිස් ස්ථානය වෙත වයිස් ස්ටෝස් එකේ මෝටර් රථයෙන්ම රැගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත. තමා පොලිස් ස්ථානයේ පිටුපසට රැගෙන ගොස් තමාගේ අත් දෙක පිටුපසට කර මාංචු දැමීමට සූදානම්වන විට තමාගේ අත එක් වතාවක් කැඩී ඇති බැවින් එසේ නොකරන ලෙස ඉල්ලීම් කළ බවත්, ඒ පිළිබඳව නොසලකා හරිමින් මාලිම්බඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ජයවික්‍රම මහතා තමාගේ අත්දෙක පිටුපසට කර මාංචු දමා අත් දෙක දෙපසට අදිමින් ඇත්ත ප්‍රකාශ කරන ලෙස තර්ජනය කරමින් පහරදුන් බවත්, සත්‍ය ප්‍රකාශ නොකළ හොත් කුඩු නඩුවක් දමා හෝ තමා සිරගත කරන බවට තර්ජනය කළ බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් තමා කිසිදු වරදක් නොකළ බවට එම නිලධාරීන්ට තමා ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. ඉන් පසු විනාඩි 45 ට පසු අත්දෙකේ මාංචු ඉදිරියට කර නැවත මාංචු දමා ඇත්ත කියන ලෙස නැවත ජයවික්‍රම මහතා සහ විජේසේකර මහතා වරින් වර පහරදුන් බවත් ඉන් පසු සිරමැදිරියට දැමූ බවත් එදින රාත්‍රියේ සිරමැදිරිය තුළ තමා සිටි බවත්, ඊට පසු දින 2020.08.25 දින උදෑසම පොලිස් ස්ථානයේ අපරාධ අංශයට රැගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත. එහිදී තමාට බිම වාඩිවෙන ලෙස ප්‍රකාශ කර විජේසේකර මහතා පරුෂ වචනයෙන් බැනවැදී තමාගේ පපුවට, බෙල්ලට, මුහුණට එම නිලධාරියාගේ පාදයෙන් සහ එම ස්ථානයේ තිබූ විකට් කූරකින් ද පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත. මද වේලාවකට පසු පොලිස් ස්ථානයේ පිටුපසට රැගෙන ගොස් පුටුවක වාඩිකරවා අත්දෙක පිටුපසට සිටින සේ මාංචු පිටුපසට කර දමා, ස්ථානාධිපති අසල සිටි නිලධාරියෙන් එඩේර මිරිස් අඹරා රෙදි කඩක ඔතා තමාගේ මුඛයට දමා ඇත්ත කියන ලෙස තර්ජනය කළ බවත් ප්‍රකාශ කර ඇත. පසුව නැවත සිරමැදිරියට දැමූ බවත්, වරින් වර සිරමැදිරියෙන් පිටතට රැගෙන තමාට පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත. 2020.08.25 වන දින රාත්‍රී 9.00 – 9.30 පමණ මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ජීප් රථය පැමිණ තමා මාතර පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බව ප්‍රකාශ කර ඇත. මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයට තමාව ගෙනිහින් තමාගේ අත් දෙක නැවත පිටුපසට කර මාංචු දැමීමට සූදානම් වන විට තමාට මාලිම්බඩ පොලිස් ස්ථානයෙන් පහරදුන් බැවින් අත් දෙක අධික වේදනාවෙන් පෙළෙන බවට ඉල්ලීම් කළ ද ඒ පිළිබඳව නොසලකා හැර අත් දෙක පිටුපසට කර මාංචු දමා තමාට පහරදුන් බවත් මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේතුංග නිලධාරියා මුදල් කොහේදැයි විමසමින් පහරදුන් බවත්, තමාට අමාරු බව කොතරම් ප්‍රකාශ කළ ද ඇත්ත ප්‍රකාශ නොකළ හොත් කිරළ කැළයට රැගෙන ගොස් බෝම්බයක් දමන බවට එම ස්ථානයේ සිවිල් ඇඳුමින් සිටි නිලධාරියෙන් තර්ජනය කරමින් පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත. එසේ පහරදී පසුව මාංචු ගලවා සිරමැදිරියට දැමූ බවත් ප්‍රකාශ කර ඇත. 2025.08.26 වන දින තමාගේ පවුලේ අය සහ මිතුරන් තමා බැලීමට පොලිස් ස්ථානයට පැමිණි බවත් එදින තමාව වරින් වර එළියට රැගෙන ප්‍රශ්න කිරීම සිදු කළ බවත් ප්‍රකාශ කර ඇත. 2020.08.27 දින උදෑසන සිරමැදිරියෙන් එළියට ගෙන තමාගෙන් නැවත සොරකම් කළ මුදල් පිළිබඳව විමසූ බවත්, වීඩියෝ දර්ශන වල සිටින්නේ තමා යැයි තර්ජනය කරමින් ප්‍රශ්න කළ බවත් තමා ඒ කිසිවක් නොදන්නා

බව ප්‍රකශ කළ බවත් ප්‍රකාශ කර ඇත. නැවත තමා සිරමැදිරියට දමා සිටියදී තමා බැලීමට තමාගේ මව සහ සහෝදරියන් දෙදෙනා සහ මිතුරන් පැමිණි බවත් ප්‍රකශ කර ඇත. එදින නීතීඥවරයෙකු ද පැමිණ තමා අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා පැමිණ කතාබහ කර ගිය පසු නැවත තමා සිරමැදිරියෙන් එළියට ගෙන අපරාධ අංශය වෙත ගෙන ගොස් තමාට මේසයක් මත හාන්සිවන ලෙස අණ කර එසේ හාන්සි වූ පසු තමාගේ යටිපතුල් වලට පොලුවලින් පහරදුන් බවත්, නැවත තමා නැගිට්ටවා තමාගේ උරහිස් වලට පොලුවලින් පහරදී ඇත්ත කියන ලෙස තර්ජනය කළ බවත් ප්‍රකාශ කර ඇත. එසේ පොලු තුනකින් තමාට වරින් වර පහරදුන් බවත්, එක් පොල්ලක් දෙකට කැඩී කැඩුණු පොල්ලෙහි ලී පතුරක් වම් කකුලෙහි දණහිසට පහලින් ඇනී තුවාල වූ බවත්, එම සිදුවීමෙන් තමාගේ කකුල තුවාලවී ලේ ගලමින් සිටියදී විනාඩි 30 – 40 පමණ නැවත යටිපතුල් වලට සහ උරහිස් වලට පහරදුන් බවත් එසේ පහරදීම හේතුවෙන් තමාගේ කකුල් දෙකම ඉදිමුණු බවත් තමාට ඇවිද ගැනීමට නොහැකිව බිම ඇද වැටුණු බවත් ප්‍රකාශ කර ඇත. තමා බිම වැටුණු පසු "නැගිටපන් උඹ දැන් එල්ලන්න හදන්නෙ" යනුවෙන් බැන වදිමින් තමාට දිගින් දිගටම පහරදුන් බවත් එසේ පහරදෙනු ලැබුවේ මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේතුංග මහතා බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී විජේතුංග මහතා විසින් එම ස්ථානයේ සිටි නිලධාරියෙක් හට කඹයක් රැගෙන ඒම සඳහා මුදල් ලබාදෙනු තමා දුටු බවත්, ඒවන විට තමා ඉතා අසාධ්‍ය තත්ත්වයේ පසු වූ බවත් තමාට තමාගේ ඇඳුම්වල ම මුත්‍රා පිටවී තිබූ බැවින් තමාට වැසිකිලියට යාමට අවශ්‍ය බව පැවසූ පසු වැසිකිලියට රැගෙන ගොස් නැවත තමා අපරාධ අංශය වෙත අතින් අල්ලාගෙන රැගෙන එන විට තමාගේ පවුලේ අය එහි රැදී සිටි බවත්, තමා රැගෙන එන ආකාරය තම පවුලේ අය දුටු බවත් තමාට ඇවිද ගැනීමට නොහැකිව වැටි වැටි පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. නැවත අපරාධ අංශයට රැගෙන ගොස් අතින් තමාගේ කනට පහරදුන් බවත් වතුර බෝතල් වලින් ද පහර දෙමින් තමාට හිට ගෙන සිටීමට ද නොහැකිව සිටියදී උඩ පනින ලෙස අණ කළ බවත් ප්‍රකාශ කර ඇත. පසුව එම ස්ථානයට තමාගේ නීතිඥවරයා පැමිණි බවත් තමාට තුවාලවී ඇති ආකාරය නීතිඥවරයා ද දුටු බවත් ඒ සමගම තමාගේ සහෝදරිය එම ස්ථානයට පැමිණ ස්ථානාධිපති විජේතුංග මහතාගෙන් "ඇයි මෙච්චර මල්ලිට ගහන්නෙ, සී සී ටී දර්ශනවල මල්ලි ඉන්නවා නම් මට පෙන්වන්න" යැයි ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. එම වීඩියෝ දර්ශන අපරාධ අංශයේ ස්ථානාධිපති විජේතුංග මහතා විසින් පෙන්වන විට එම දර්ශන තමාගේ සහෝදරියන් දෙදෙනා, මව සහ තමාගේ මිතුරන් වන ජනිත්, අවිශ්ක යන අය ද එය නැරඹූ බවත්, එම දර්ශන නරඹමින් සිටින විට එම ස්ථානයට මාලිම්බඩ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේසේකර මහතා පැමිණ මාලිම්බඩ පොලිස් ස්ථානයේ තිබූ තමාගේ හෙල්මටය සහ දුරකථනය මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේතුංග නිලධාරියාට භාරදුන් බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී තමාගේ පවුලේ අය සහ මිතුරන් විජේසේකර මහතා රැගෙන පැමිණි මාගේ හෙල්මටය shine color එකක් සහ Batch එකක් සහිත හෙල්මටයක් වන බවත් සොරකම සිදුවන වීඩියෝ දර්ශනයේ ඇති හෙල්මටය ඊට හාත්පසින්ම වෙනස් හෙල්මටයක්

බවත් පැහැදිලි කළ බව ප්‍රකාශ කර ඇත. එම පැහැදිලි කිරීම් වලින් පසුව මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේතුංග මහතා "මට ලොකු වැරදීමක් වුනේ, මට සමාවෙන්න, විජේසේකර මහත්තයා මේ ටික පොඩ්ඩකට කලින් ගෙනාවන් හරි. මගේ ජීවිතේට සිදුවුන දෙවැනි වැරැද්ද" යනුවෙන් නිලධාරියා ඔලුවේ අතගසා ගත් බවත් තම මවගෙන් වැද සමාව ඉල්ලූ බවත් ප්‍රකාශ කර ඇත. පසුව තමාට අමාරු බව ප්‍රකාශ කළ ද තමා රෝහල් ගත කිරීම සිදු නොකළ බවත්, අධිකරණයට ඉදිරිපත් නොකළ බවත් 1990 සුවසැරිය ගෙන්වා ගිලන් රථය තුළ තබා තමාට ප්‍රතිකාර ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. මෙම සියලුම සිදුවීම් 2020.08.27 වන දින සිදුවූ බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එදිනම විජේතුංග මහතා තමාගේ මිතුරන්ට මුදල් ලබාදී බෙහෙත් ගෙන්වා ගත් බවත් පොලිස් නිලධාරීන් ලවා තමාගේ කකුල් අත පය තවා ක්‍රීම් ආලේප කළ බවත්, තම මව තමාව නිවසට රැගෙන යාමට දෙන ලෙස ඉල්ලීම් කළ ද, දුරකථන වාර්තා පැමිණීමට ඇති බැවින් එදින රැගෙන යාමට ලබාදිය නොහැකි බව ප්‍රකාශ කළ බැවින් තමා එදින ද මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ සිටි බව ප්‍රකාශ කර ඇත. 2020.08.28 දින පොලිස් ස්ථානය තුළම තමාට ප්‍රතිකාර කරමින් සිටි බවත් එදින ද තමාගේ පවුලේ අය සහ මිතුරන් තමා බැලීමට පොලිස් ස්ථානයට පැමිණි බවත් එදින ද තමාගේ දුරකථන වාර්තා නොපැමිණි බැවින් රැගෙන යාමට නොහැකි බව මවට ප්‍රකාශ කළ අතර, එදින රාත්‍රියේ පියාට පෙන්වීම සඳහා නිවසට රැගෙන ඒමට කටයුතු කරන බවට විජේතුංග මහතා සිය මවට දැනුම්දුන් බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව රස්සන්දෙනිය ප්‍රදේශයේ පදිංචි පොලිස් රියදුරු මහතාගේ මෝටර් රථයෙන් විජේතුංග මහතා සහ තවත් නිලධාරීන් කිහිප දෙනෙකු සමග තමා නිවසට රැගෙන ගොස් තමා පියාට පෙන්වා නැවත පොලිස් ස්ථානයට රැගෙන පැමිණි බව ප්‍රකාශ කර ඇත. 2020.08.29 දින ද තමා මාතර පොලිස් ස්ථානයේ සිටියදී තම පවුලේ අය සහ මිතුරන් තමා බැලීමට පැමිණි බවත් එදින තමාව නිවසට යවන බව ප්‍රකාශ කළ බැවින් පැමිණි පිරිස පොලිස් ස්ථානයේ සවස් වන තුරු රැඳී සිට තමා නිදහස් නොකළ බැවින් පිටවී ගිය බවත් ප්‍රකාශ කර තිබේ. පසුව එදිනම විජේතුංග මහතා සහ තවත් නිලධාරීන් කිහිප දෙනෙකු සමග තමාගේ මිතුරෙකුගේ ද උදව් සහිතව මාතර පොලිස් ස්ථානයේ ජීප් රථයෙන් තමාගේ ව්‍යාපාර ස්ථානයට රැගෙන ගොස් මද වේලාවක් එහි රැඳී සිටි බවත් පසුව නිවසට රැගෙන ගිය බවත් විජේතුංග මහතා විසින් තම නිවැසියන්ට මෙම සොරකමට තමා සම්බන්ධයක් නොමැති බවට ප්‍රකාශ කළ බවත්, තමාගේ කකුල් වල ඉදිමුම නැතිවීම සඳහා කකුල් තවන ලෙසට මවට දැනුම් දෙනු ලද බවත් එවිට තම මව විසින් "හොඳට තවල හදලා තිබුණේ. සර් ගහල අතපය කැඩුනේ" යනුවෙන් ප්‍රකාශ කළ බවත්, එවිට විජේතුංග මහතා කකුල් තැවීම සඳහා පොලිස් නිලධාරියෙක් නතර කිරීමට හැකි බව ද ප්‍රකාශ කළ බවත් පසුව ඔවුන් පිටත්ව ගිය බවත් සඳහන් කර ඇත. ඉන් පසු දිනක තමා පවුලේ අය සමග කාලිදාස පාරේ පිහිටි සහකාර පොලිස් අධිකාරී කාර්යාලයට ගොස් සහකාර පොලිස් අධිකාරී එච්. කේ. එස්. විජයගුණවර්ධන මහතා හමුවී තමාගේ තැලුම් තුවාල පෙන්වා තමාට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් පැවසූ විට එම නිලධාරියා කෝපගෙන බැන වැදී බෙහෙත් ගෙන ටික කාලයක් ගත වන විට තුවාල සහ තැලීම් සුවවේවි යැයි

ප්‍රකාශ කරමින් කිසිදු ස්ථානයකට පැමිණිලි කිරීම සඳහා යාමට අවශ්‍ය නොමැති බවත් රෝහල් ගත වීමට ද අවශ්‍ය නොමැති බවත්, තමාට අවශ්‍ය සියලු ප්‍රතිකාර කටයුතු සිදු කිරීම සඳහා මාතර පොලිස් ස්ථානයේ විජේතුංග නිලධාරියාට එතුමා උපදෙස් ලබාදී ඇති බවත් ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. ඉන්පසු තමා පවුලේ අය සමග නියෝජ්‍ය පොලිස්පතිතුමා හමුවීමට ගිය බවත් නියෝජ්‍ය පොලිස්පතිතුමා නොසිටි බවත් එම කාර්යාලයේ සිටි රාජපක්ෂ නැමැති නිලධාරියා වෙත තමාට සිදුවූ අසාධාරණය පිළිබඳව ප්‍රකාශ කළ බවත් සහකාර පොලිස් අධිකාරී කාර්යාලයට ගිය අවස්ථාවේ සිදුවූ සිදුවීම ද රාජපක්ෂ නිලධාරියාට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. එහිදී රාජපක්ෂ නිලධාරියා ද ඉහළ පොලිස් නිලධාරීන් හමුවී මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට නොයන ලෙසත් පැමිණිල්ලක් සටහන් කිරීමට නොයන ලෙසත් “පොලිසියේ හැටි දන්නවා නේද? ගොරකත් දඩ මස් කරන්න පුලුවන්නේද?” යනුවෙන් ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. එම නිලධාරියා ප්‍රකාශ කළ දේවල් හේතුවෙන් තමා ඉතා කළකිරීමට පත් වූ බවත් රෝහල් ගතවීමට කටයුතු නොකළ බවත් නැවත නිවසට පැමිණි බවත් සඳහන් කර ඇත. මෙම සිදුවීමෙන් පසු දින කිහිපයක් සමූපකාර රෝහලේ තුවාල සඳහා බෙහෙත් දැමීමට මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ජීප් රථයෙන් පොලිස් නිලධාරීන් විසින් රැගෙන ගිය බවත් 2020.08.31 දින තමාට පපුවේ කැක්කුම වැඩි වූ බවත් ඒ හේතුවෙන් පොලිස් නිලධාරීන් තමා මාතර සමූපකාර රෝහලට රැගෙන ගොස් එක්ස්රේ ලබාගත් බවත් රෝහලෙන් තමාට බෙහෙත් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. ඉන් පසු දිනක නියෝජ්‍ය පොලිස්පතිතුමා හමුවීමට ගොස් තමාගේ තුවාල පෙන්වා සිදුවූ අසාධාරණය ප්‍රකාශ කළ පසු එතුමා විසින් ද මාතර පොලිස් ස්ථානයේ විජේතුංග මහතා සියලුම දේ බලාගන්නා බවත් නැවත තමාට පොලිස් නිලධාරීන්ගෙන් කිසිදු අසාධාරණයක් නොවන බවත් වෙනත් ගැටලුවක් ඇතිවුවහොත් ඇමතුමක් ලබාදෙන ලෙසත් ප්‍රකාශ කර තමා පිටත්කර හැරිය බව සඳහන් කර ඇත. එහෙත් තමාට දිගින් දිගටම පාද වල වේදනාව, කකුල්වල ඉදිමීම අඩු නොවූ බැවින් නැවත 2020.09.14 දින මාතර පොලිස් නිලධාරීන් මාතර සමූපකාර රෝහල වෙත රැගෙන ගිය පසු තමාගේ පාද දෙකේම එක්ස්රේ ලබාගත් බව ප්‍රකාශ කර ඇත. එහිදී වෛද්‍යවරුන් විසින් තමාගේ කකුල් දෙකේම යටිපතුල්වල අස්ථි කැඩී ඇති බව ප්‍රකාශ කළ නමුත් පොලිස් නිලධාරීන් තමාගේ පවුලේ අයට ප්‍රකාශ කරනු ලැබුවේ සිදුවී ඇත්තේ කුඩා හානියක් බවයි. 2020.09.16 දින නැවත රෝහල රැගෙන යාමට පෙර මාතර පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් එහිදී විජේතුංග මහතා විසින් තමා තාප්පයෙන් වැටුණු බවට රෝහලට ප්‍රකාශ කරන මෙන් දැනුම්දුන් බවත්, එහි සිටි පොලිස් නිලධාරීන්ට ද තමා තාප්පයෙන් වැටුණු බවට ප්‍රකාශ කරන ලෙසට උපදෙස් ලබාදුන් බවත්, රෝහල් පොලිසියේ නිලධාරීන්ට ද ඒ ආකාරයට එතුමා විසින් දැනුම්දීම සිදුකරන බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. ඒ අනුව තමා මාතර රෝහලට රැගෙන ගොස් තමාව රෝහල් පොලිසියේ එළියේ තබා පොලිස් නිලධාරීන් ඇතුළට ගොස් කතා කර පැමිණ තමා රෝහල් සායනයට රැගෙන ගොස් තමා තාප්පයෙන් වැටී කකුල තුවාලවී ඇති බවට එහි සිටි වෛද්‍යවරයාට ප්‍රකාශ කළ බවත්, තමා බියට සත්‍ය ප්‍රකාශ නොකළ බවත් සමූපකාර

රෝහලේ එක්සේරේ එක පෙන්වූ පසු "වෙන්න ඕන දේවල් කකුලට වෙලා තියෙන්නෙ" යනුවෙන් එම වෛද්‍යවරයා ප්‍රකාශ කළ බවත් පසුව වම් කකුලේ පතුලේ සිට ඉහළට වන තෙක් වෙලුම්පටි දැමූ බවත් පසුව තමාව නාවිමනේ පිහිටි පොලිස් නිලධාරියෙකුගේ නිවසට රැගෙන ගොස් තමාට කිහිලිකරුවක් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. නැවත මාතර පොලිස් ස්ථානයට රැගෙන ගිය පසු තමාට රෝද පුටුවක් රැගෙන දෙන බවට විජේතුංග නිලධාරියා ප්‍රකාශ කළ බවත් පොලිස් නිලධාරීන් විසින් තමාව නිවසට රැගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත. පසුව නැවත කිහිප වරක් බෙහෙත් දැමීම සඳහා පොලිස් නිලධාරීන් විසින් තමාව රැගෙන ගිය බව ප්‍රකාශ කර ඇත. 2020.09.29 වන දින සහකාර පොලිස් අධිකාරී කාර්යාලයෙන් තමාට කැඳවීමක් ලැබුණු බවත් ඒ අනුව එහි ගිය පසු සහකාර පොලිස් අධිකාරී එච්. කේ. එස්. විජයගුණවර්ධන මහතා විසින් තමා ඉහළට පැමිණිලි කිරීම සම්බන්ධයෙන් බැන වැදී කැමති ආකාරයෙන් කටඋත්තරයක් දී යන ලෙස දෝෂාරෝපණය කළ බව සඳහන් කර ඇත. නැවත 2020.10.06 මිතුරෙකු සමග නැවත වරක් කටඋත්තරයක් ලබාදීම සඳහා සහකාර පොලිස් අධිකාරී කාර්යාලය වෙත ගොස් එදින නිවසට නොගොස් තමා රියදුරෙකු වශයෙන් මීට පෙර රැකියාව කළ දෙව්නුවර රාස්සන්දෙනිය පන්සලට පැමිණි බව සඳහන් කර ඇත. ඊට පසු දින එනම් 2020.10.07 වන දින කකුලට දැමූ බැන්ඩේජ් එක ගැලවීම සඳහා මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ජීප්රථයේ රියදුරු රාස්සන්දෙනිය ප්‍රදේශයේම පදිංචිකරුවෙකු වන බැවින් එම පොලිස් රියදුරුමහතා එතුමාගේ මෝටර් රථයෙන් පන්සලට පැමිණ තමාව රැගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත. එම කකුලේ බැන්ඩේජ් එක ගළවා අනෙක් කකුල ඒවන විට ගල්වෙලා තිබූ බැවින් බැන්ඩේජ් කිරීම අවශ්‍ය නොමැති බව වෛද්‍යවරයා ප්‍රකාශ කළ බවත් නැවත 2020.10.28 සායනයට පැමිණෙන ලෙස දැනුම්දුන් බවත් තමා නැවත පන්සලට පැමිණ දින දෙක තුනක් පන්සලේ නතරවී සිට නිවසට ගිය බවත් ප්‍රකාශ කර ඇත. නිවසේ සිටින විට නැවත තමාගේ කකුලේ වේදනාව ඒවන විටත් පහව ගොස් නොතිබූ බැවින් රෝහල් ගතවීමට අවශ්‍ය වුවද ඉහළ පොලිස් නිලධාරීන් තමාට රෝහල් ගත නොවන ලෙස දැනුම්දුන් බැවින් වේදනාව ඉවසා සිටිය ද දිගින් දිගටම වේදනාව අඩු නොවූ බැවින් තම ජීවිතයට හානියක් සිදුවේයැයි ඇතිවූ බිය හේතුවෙන් 2020.10.15 දින මාතර රෝහලට ඇතුළත් වූ බව ප්‍රකාශ කර ඇත. එදින පොලිස් නිලධාරීන් තමාට පහරදුන් බව වෛද්‍යවරයාට ප්‍රකශ කළ බවත් එදින ද එක්ස්රේ ලබාගත් බවත්, තමා රෝහලේ සිටියදී රෝහල් පොලිසියේ නිලධාරියෙක් පැමිණ අධිකරණ වෛද්‍යවරයාට පෙන්වීමට අවශ්‍යදැයි විමසූ බවත් තමාට සිදුවූ අසාධාරණය හේතුවෙන් අධිකරණ වෛද්‍යවරයාට යොමුවිය යුතු බවට ඉල්ලීම් කළ බැවින් තමා අධිකරණ වෛද්‍යවරයාට යොමුකළ බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් මෙම සිදුවීම සිදුවී කාලයක් ගතවී ඇති බැවින් මීට පෙර නොපැමිණීමට හේතු විමසූ බවත්, ඊට හේතුව ලෙස තමා පොලිස් නිලධාරීන්ට තිබූ බියට සහ ඉහළ නිලධාරීන්ගේ බලපෑම මත රෝහල් ගත නොවූ බව ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. පසුව එදින එනම් 2020.10.16 දින ටිකට් කපා නැවත 2020.10.28 දින සායනයට පැමිණෙන ලෙස දැනුම්දුන් බවත් ප්‍රකාශ කර ඇත. තමාට මාලිම්බඩ පොලිස් ස්ථානයේ 1990 සුවසැරියේ සේවය

කරන රියදුරු මහතා වන සමිත් යන අය දුරකථ ඇමතුමක් ලබාදී මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේතුංග මහතා විසින් වයිස් ස්ටෝස් එකේ හිමිකරුගෙන් මුදල් ලබාගෙන තමාට ලබාදිය හැකි බවත් විජේතුංග මහතාට දුරකථන ඇමතුමක් ලබාදෙන ලෙස පණිවිඩයක් ඉහත කී අය අතේ එවා තිබූ බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් තමාට මුදල් අවශ්‍ය නොවන බව තමා දැනුම්දුන් බව සඳහන් කර තිබේ. තමාගේ කකුල් දෙකේ සහ අත්වල වේදනාව අඩු නොවූ බවත්, තමාගේ ව්‍යාපාර කටයුතු සිදුකර ගැනීමට හෝ අමතර රැකියා ලෙස සිදුකරන රියදුරු රැකියාව ද සිදු කළ නොහැකි බව ප්‍රකාශ කර ඇත.

<u>පැමිණිල්ල සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සාක්ෂි</u>

1. පැමිණිලි පාර්ශවය විසින් වින්දිත දිල්ශාන් මධුෂංක යන අයට සිදුවූ තුවාල සනාථ කිරීම සඳහා ගන්නා ලද ඡායාරූප කිහිපයක් ඉදිරිපත් කර ඇත. එසේම මාතර සමුපකාර රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් බවට තහවුරු කරන ලද ලේඛන ඉදිරිපත් කර ඇත.

2. මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඩබ්. දිල්ෂාන් මධුෂංක යන අය 2020.10.15 වන දින මාතර මූලික රෝහලට ඇතුළත්වී ඇති අතර, අනුක්‍රමික අංක MLEF/SHS/M/2020/4407 සහ අධිකරණ වෛද්‍ය නිරීක්ෂණ පත්‍ර අංක 1603/20 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි සඳහන් කරුණු පහත පරිදි වේ. වෛද්‍ය වාර්තාවෙහි රෝග ඉතිහාසය තුළ "මාලිම්බඩ පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති තමන්ගේ අත් සහ යටිපතුල් වලටත් පහරදුන් බවත් යටිපතුල් දෙකට ලීයකින් පහර දුන් බවත් එම සිදුවීම 2020 වර්ෂයේ ජුලි හෝ අගෝස්තු මාසයේ 24, 25 යන දිනවල සිදු බවට ප්‍රකාශ කර ඇත. එසේම මාතර පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති හෝ මාතර පොලිසිය විසින් ලී පොල්ලකින් යටිපතුල් දෙකට, පිටුපසට සහ පපුවට පහරදුන් බව ද ප්‍රකාශ කර ඇත."

   එකී රෝග ඉතිහාසය අනුව රෝගියා පරීක්ෂා කරනු ලැබූ අධිකරණ වෛද්‍යවරයා විසින් මෙම පුද්ගලයා 2020.10.16 වන දින පෙ.ව. 11:48 ට පමණ පරීක්ෂා කරන විට ඔහුගේ තුවාල කිසිවක් නොවූ බවත්, ඔහු 2020.09.14 දින පුද්ගලික රෝහලකින් එක්ස් රේ ජයාරූප ලබාගෙන ඇති බවත් වම් කකුලේ මහපට (පලවෙනි) ඇඟිල්ලේ අස්ථි බිඳීමක් හා දකුණු කකුලේ මහපට (පලවෙනි) සුලඟිල්ල (පස්වෙනි) සහ වෙදැඟිල්ල (හතරවෙනි) ඇඟිලිවල අස්ථි බිඳීමක් නිරීක්ෂණය වූ බවත්, වින්දිත පුද්ගලයා එම අවස්ථාවේදී තම තුවාල සම්බන්ධයෙන් කිසිවක් දැනුම් නොදුන් බවත් සඳහන් කර ඇත.

   තවද වෛද්‍යවරයාගේ මතය ලෙස,

   i. බරපතල තුවාල කිසිවක් නොවන බවත්,

ii. තුවාල සිදු වූ ආකාරය පිළිබඳව කිසිවක් සඳහන් නොකර තුවාල අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත දැනුම් නොදී ඇති බවත් වැඩිදුර සටහන්හි සඳහන් කර ඇත.

3. **දිවුරුම් ප්‍රකාශ මඟින් සාක්ෂි ඉදිරිපත් කිරීම**

පළමු දිවුරුම් ප්‍රකාශය ලෙස වින්දිත පාර්ශවය වන ඩබ්. දිල්ෂාන් මධුෂංක යන අයගේ මව විසින් දිවුරුම් ප්‍රකාශයක් ලබාදී ඇති අතර, එකී දිවුරුම් ප්‍රකාශය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ලේ සඳහන් කරුණුම සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

දෙවන දිවුරුම් ප්‍රකාශය ලෙස, වින්දිත පාර්ශවය වන ඩබ්. දිල්ෂාන් මධුෂංක යන අයගේ සමීප මිතුරෙකු සහ මෙම සිදුවීම් ඇසින්දුටු සාක්ෂිකාරයෙකු වන හේවාගමගේ ජනිත් මදුශංක යන අය විසින් 2021.01.06 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් පහත පරිදි සාක්ෂි ලබාදී ඇත. තමා තෙලිජ්ජවිල හන්දියේ පිහිටි තමාගේ මිතුරාගේ ත්‍රී ස්ටාර් මොබයිල් ආයතනයේ සේවය කරන ලද බවත් 2020.08.24 වන දින තමා එම ආයතනයේ සේවය කරමින් සිටියදී එහි සිටි දිල්ෂාන් මදුශංක යන (වින්දිත පාර්ශවය) අය මාලිම්බඩ පොලිසිය විසින් සිදු කරන ලද කැඳවීමක් අනුව පොලිස් ස්ථානය වෙත ගිය බවත්, පොලිස් ස්ථානයට පිටත්ව ගිය පසු ඔහු පිළිබඳව කිසිදු තොරතුරක් දැනගැනීමට නොලැබූ බවත් ප්‍රකාශ කර ඇත. පසුව තමා මිතුරා පිළිබඳව සොයාබැලීමේදී ඔහු මාලිම්බඩ පොලිස් ස්ථානයේ සිටින බව දැනගත් බැවින්, 2020.08.25 වන දින ඔහුට රාත්‍රී ආහාරය රැගෙන මාලිම්බට පොලිස් ස්ථානය වෙත රාත්‍රී 8 – 9 ත් අතර ගිය බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී මිතුරා මාලිම්බඩ පොලිස් ස්ථානයේ නොසිටි බවත්, ඒ වන විට ඔහු මාතර පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත්, මාලිම්බඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් තමාට ප්‍රකාශ කරන ලද බවත් තවද, එම අවස්ථාවේදී මාලිම්බඩ පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ ප්‍රධාන පොලිස් නිලධාරි විජේසේකර මහතා තමාට පරුෂ වශයෙන් බැන වැදී තමාගේ දුරකථනය සහ බඳපටි ඉවත් කරන ලෙස විධාන කොට තමා පොලිස් සිර මැදිරියට දැමූ බවත්, ඒ අනුව තමා 2020.08.26 වන දින සවස් යාමය වන තෙක් මාලිම්බඩ පොලිස් සිරිමැදිරියේ රඳවා සිටි බවත්, වරින් වර පැමිණ තමා හට අපරාධ විමර්ශන අංශයේ ප්‍රධාන පොලිස් නිලධාරී මහතා පරුෂ වශයෙන් බැණ වැදුණු බවත්, එදින සවස තමා හට මාලිම්බඩ පොලිස් ස්ථානයෙන් ඇප ලබාදීමෙන් අනතුරුව තමා නැවත මාතර පොලිස් ස්ථානය වෙත ගිය බවත් එහිදී දිල්ෂාන් යන අය මාතර පොලිස් ස්ථානයේ සිර මැදිරියේ රඳවා සිටිනු දුටු බවත් ප්‍රකාශ කර ඇත. නැවත 2020.08.27 වන දින තමා මාතර පොලිස් ස්ථානය වෙත ගිය බවත් එහිදී දිල්ෂාන් යන අයට මාතර පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති වන විජේතුංග නිලධාරියා විසින් දිල්ශාන් යන අයට පහරදී සිටි අයුරු දුටුබවත්, එම අවස්ථාවේදී තමා ඉදිරියේදී ද තම මිතුරාට පහර දෙන අයුරු තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත. එසේ පහරදෙන විට දිල්ෂාන් යන අය බිම වැටුණු බවත් ඔහුගේ දෙපාවලින් රුධිරයේ වැගිරෙන ආකාරය සහ ඔහුට විජේතුංග නිලධාරී මහතා විසින් උඩ පනින ලෙස නියෝග

කළ බවත්, එම නිලධාරියා විසින් දිල්ෂාන්ගේ කනට පහර දුන් බවත්, වතුර බෝතල් වලින් පහර දෙන ආකාරය තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත.

තෙවන දිවුරුම් ප්‍රකාශය 2020.08.24 වන දින මාලිම්බඩ පොලිස් ස්ථානයේ සේවය කළ ජිනසිරි කරුනාසිංහ යන නිලධාරියා විසින් **වින්දිත පාර්ශවය වන ඩබ්. දිල්ෂාන් මධුෂංක යන අයට එම පොලිස් ස්ථානයේදී සිදුවූ පහරදීම දුටු බවට 2021.03.13 දිනැතිව පහත පරිදි දිවුරුම් ප්‍රකාශයක් මගින් සාක්ෂි ලබාදී ඇත.** 2020.08.24 වන දින මාලිම්බඩ පොලිස් ස්ථානයේ තමා සේවයේ නියුතුව සිටි බවත් එදින තෙලිජ්ජවිලි, රබර් කොරටුව, පැලිගලහේන හි පදිංචි වලවේ දූරගේ දිල්ෂාන් මදූශංක යන අය සැකපිට ප්‍රශ්න කිරීම සඳහා මාලිම්බඩ පොලිස් ස්ථානයට රැගෙන විත් තිබූ බවත්, එදින සවස 4-5 ත් අතර පමණ කාලයේදී වලවේ දූරගේ දිල්ෂාන් මදූශංක යන අය මාලිම්බඩ පොලිස් ස්ථානයේ බැරැක්කයට රැගෙන ගොස් මාලිම්බඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති චන්ද්‍ර ජයවික්‍රම මහතා සහ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේසේකර යන නිලධාරි දෙදෙනා විසින් වලවේ දූරගේ දිල්ෂාන් මදූශංක යන සැකකරුගේ අත්දෙක පිටුපසට කරවා මාංචු දමා ඉතා අමානුෂික ලෙස පහරදෙනු තමා සියැසින් දුටු බවට ප්‍රකාශ කර ඇත.

සිව්වන දිවුරුම් ප්‍රකාශය ලෙස, **වින්දිත පාර්ශවය වන ඩබ්. දිල්ෂාන් මධුෂංක යන අයගේ සහෝදරියක් වන** වලවේ දූරගේ මධුෂා කුමාරි යන අය විසින් 2021.01.06 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් පහත පරිදි සාක්ෂි ලබාදී ඇත. තමාගේ සහෝදරයා වන වලවේ දූරගේ දිල්ෂාන් මදූශංක යන අය 2020.08.24 වන දින මාලිම්බඩ පොලීසියෙන් රැගෙන ගිය බව තමා හට දැනගන්නට ලැබූ බැවින් එදින සවස 5.00 ට පමණ මාලිම්බඩ පොලිසිය වෙත තමාගේ සහෝදරයා බලන්න ගිය බවත්, එවිට පොලිස් ස්ථානය විසින් තමාගේ සහහෝදරයා පොලිසියේ රඳවාගෙන නොමැති බවට ප්‍රකාශ කළ බවත්, පසුව තමා 2020.08.26 වන දින මාතර පොලිසියට ගොස් තමාගේ සහෝදරයා එම පොලිසියේ සිටිනවාද යන්න සොයා බැලූ බවත්, එවිට එම පොලිස් ස්ථානයේ තම සහෝදරයා සිටින බවට තමා දැනගත් පසු නැවතත් 2020.08.27 දින මාතර පොලිස් ස්ථානයට නැවත සහෝදරයා බැලීම සඳහා ගිය බවත්, එහි යන විට අපරාධ අංශයේ භාර පොලිස් නිලධාරී විජේතුංග මහතා විසින් තමාගේ සහෝදරයාට පහර දෙන ආකාරය තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත.

පස්වන දිවුරුම් ප්‍රකාශය වශයෙන් වින්දිත පාර්ශවය වන වලවේ දූරගේ දිල්ෂාන් මධුශංක යන අයගේ මිතුරෙක්වන වීබද්දේ ආරච්චිගේ ජීවන් සමීර යන අය විසින් 2020.08.24 දින සිදුවූ සිදුවීම සම්බන්ධයෙන් 2021.01.06 දිනැති දිවුරුම් ප්‍රකාශයක් මගින් පහත පරිදි සාක්ෂි ඉදිරිපත් කර ඇත. වලවේ දූරගේ දිල්ෂාන් මධුශංක යන අය මාලිම්බඩ පොලීසිය අත්අඩංගුවේ සිටියදී 2020.08.24 වන දින රාත්‍රී 7.30 ට පමණ තමා විසින් ඔහු බැලීමට ගිය බවත්, එම අවස්ථාවේදී අත්අඩංගුවේ සිටි තමාගේ මිත්‍රයා වන දිල්ෂාන් මධුශංක යන අය බැලීමට පොලිස් නිලධාරීන් ඉඩ ලබා නොදුන්

බවත් තමා පොලිස් ස්ථානයෙන් එළවා දැමූ බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී පොලිසිය තුළ සිටි තම මිත්‍රයා වේදනාවෙන් කෑ ගසන ශබ්දය තමාට ඇසුණු බවත් එම සිදුවීමෙන් පසු 202008.25 වන දින රාත්‍රියේ ඔහුව බැලීමට ගිය බවත්, එදින ද පොලිස් නිලධාරීන් තමා එළවා ගත් බවත් මාලිම්බඩ පොලිසිය මගින් දිල්ෂාන් මදුශංක නමැති තමාගේ මිත්‍රයා මාතර පොලිසියට භාරදීමෙන් පසු 2020.08.26 වන දින රාත්‍රියේ ඔහු බැලීමට මාතර පොලිස් ස්ථානයට ද ගිය බවත්, මාතර පොලිසියේ නිලධාරීන් විසින් ද එයට ඉඩ ලබානොදුන් බවත් ප්‍රකාශ කර ඇත.

හයවන දිවුරුම් ප්‍රකාශ ලෙස, වින්දිත පාර්ශවය වන වලවේ ධූරගේ දිල්ෂාන් මදුශංක යන අයගේ මිතුරෙකු වන රත්නායක මුදියංසේලාගේ අවිශ්ක ප්‍රාන් යන අය විසින් 2021.01.06 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් පහත පරිදි සාක්ෂි ලබාදී ඇත. වලවේ ධූරගේ දිල්ෂාන් මදුශංක යන තමාගේ මිත්‍රයා 2020.08.25 වන දින මාලිම්බඩ පොලිස් ස්ථානය අත්අඩංගුවේ පසු වූ බවත්, තමා යහලුවා බැලීම සඳහා මාලිම්බඩ පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේදී මාලිම්බඩ පොලිසිය විසින් තමාගේ මිතුරාට ඉතා අමානුෂික ලෙස පහර දෙනු තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත. ඉන්පසු මාලිම්බඩ පොලිසිය විසින් 2020.08.25 වන දින තමාගේ මිත්‍රයා වන දිල්ෂාන් මාතර පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් තිබූ බවත්, 2020.08.27 වන දින තමා දිල්ෂාන් බැලීමට මාතර පොලිස් ස්ථානයට ගිය බවත් එහිදී තමා ඉදිරියේම මාතර පොලිසිය විසින් ඉතා අමානුෂික ලෙස තමාගේ මිතුරාට පහර දෙන ආකාරය තමා සියැසින් දුටු බවත් ප්‍රකාශ කර ඇත.

හත්වන දිවුරුම් ප්‍රකාශය ලෙස, වින්දිත පාර්ශවය වන වලවේ ධූරගේ දිල්ෂාන් මදුශංක යන අයගේ සහෝදරියක් වන වලවේ දූරගේ ලංකා ලක්මාලි යන අය විසින් 2021.01.06 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් පහත පරිදි සාක්ෂි ඉදිරිපත් කර ඇත. 2020.08.27 වන දින මාතර පොලිසියට ගොස් තමාගේ සහෝදරයා වන වලවේ ධූරගේ දිල්ෂාන් මදුශංක යන අය එම පොලිසියේ සිටිනවා ද යන්න සොයා බලන විට එම පොලිස් ස්ථානයේ සිටින බවට තමාට දැනගන්නට ලැබුණු බවත්, නැවතත් 2020.08.27 වන දින මාතර පොලිස් ස්ථානයට යන විට අපරාධ අංශ භාර පොලිස් නිලධාරී විජේතුංග මහතා විසින් තමාගේ සහෝදරයාට පහර දෙන ආකාරය තමා සියැසින් දුටු බවත් ප්‍රකාශ කර ඇත.

අටවන දිවුරුම් ප්‍රකාශය ලෙස, වින්දිත පාර්ශවය වන වලවේ ධූරගේ දිල්ෂාන් මදුශංක යන අයගේ මිතුරෙකු වන හේරත් මුදියන්සේලාගේ දූෂාන්ත පුෂ්පකුමාර යන අය විසින් 2021.01.06 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් පහත පරිදි සාක්ෂි ඉදිරිපත් කර ඇත. තමාගේ මිතුරා වන වලවේ දූරගේ දිල්ෂාන් මදුශංක යන අය 2020.08.26 වන දින මාතර පොලිස් ස්ථානයේ පොලිස් අත්අඩංගුවේ සිටියදී ඔහු බැලීමට තමා ගිය බවත්, සිරමැදිරියේ සිටි තම මිතුරා සමග කතා කරන විට ඔහුට මාලිම්බඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් පහර දුන් බවට තමාට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

නමවන දිවුරුම් ප්‍රකාශය ලෙස, වින්දිත පාර්ශවය වන වලවේ ධූරගේ දිල්ෂාන් මදුශංක යන අයගේ මිතුරෙකු වන අබේරත්න ධනුෂ්ක ජීවන්ත යන අය විසින් 2021.01.04 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් පහත පරිදි සාක්ෂි ඉදිරිපත් කර ඇත. වලවේ ධූරගේ දිල්ෂාන් මදුශංක යන තම මිත්‍රයා මාලිම්බඩ පොලිස් ස්ථානය විසින් අත්අඩංගුවට ගෙන මාතර පොලිස් ස්ථානය වෙත භාරදී මාතර පොලිස් ස්ථානයේ රඳවා තබා සිටිනු තමා දුටු බවත්, 2020.08.26 වන දින සහ 27 වන දින දෙකේම ඔහු බැලීමට මාතර පොලිස් ස්ථානයට තමා ගිය බවත්, 2020.08.27 වන දින ඔහු අසනීප තත්ත්වයෙන් සිටිනු දුටු බවත් ඊට හේතුව විමසා බැලීමේදී තම මිතුරාට පහරදී ඇති බවත් ඔහු වේදනාවෙන් සිටින බවට තමාට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම**

**01 වන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක නුවන් බුද්ධික විජේතුංග මහතාගේ ප්‍රකාශ සහ පරීක්ෂණයේදී හෙළි වූ කරුණු**

2024.10.18 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයට සහභාගි වෙමින් පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ, සැකකරු අත්අඩංගුවට ගැනීමට හේතුව තෙලිජ්ජවිල වයින් ස්ටෝර්ස් එක සොරුන් බිඳ මංකොල්ල කෑම පිළිබඳ සිදු කරන ලද විමර්ශනයේදී යතුරකින් සේප්පුව ඇර තිබූ බැවින් එහි සේවකයන් සහ ඔවුන් ලඟින් ඇසුරු කල අය සැක කල හෙයින් මෙම වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගත් බවත් එසේම සැකකරු අත්අඩංගුවට ගත් දිනය ලෙස පැමිණිල්ල මඟින් 2020.08.24 වන දින ලෙස සඳහන් කර ඇති මුත් එය ප්‍රතික්ෂේප කරන බවත් ඔහු අත්අඩංගුවට ගනු ලැබුවේ 2020.08.29 වන දින ප.ව. 3 ට පමණ බවත් මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවට අදාල තොරතුරු සහ කරුණු උධෘත හා දිවුරුම් ප්‍රකාශ මඟින් ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

**පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුගෙන් කල වැඩිදුර කරුණු විමසීමේදී**

අ. මෙම වගඋත්තරකරු විසින් කොමිෂන් සභාවට ලබාදී ඇති 2021.01.13 දිනැති දිවුරුම් ප්‍රකාශයට අනුව 2020.08.28 දිනෙන් පසුව වරින් වර දිල්ෂාන් මධුෂංක යන අය පොලිස් ස්ථානයට කැඳවා විමසීම් කර ඇති බව සඳහන් වන බැවින් ඒ පිළිබඳ වගඋත්තරකරුගෙන් කරුණු විමසීමේදී, 2020.08.25 දිනෙන් පසු 2020.08.26, 27 සහ 28 දිනයන්හිදී මෙම පැමිණිලිකරු පොලිස් ස්ථානය වෙත කැඳවා වරින් වර කරුණු විමසූ බවත් ඒ අවස්ථාවට ඔවුන්ගේ ඥාති සහ දෙමාපියන් පැමිණි බවත් මොහු නිශ්චිතව අත්අඩංගුවට ගත් දිනය 2020.08.29 වන දින බවට ප්‍රකාශ කර ඇත.

ආ. මෙම වින්දිත පුද්ගලයා මාලිම්බඩ පොලිස් ස්ථානයෙන් අත්අඩංගුවට ගෙන 2020.08.26 දින සිට 2020.08.29 වන දින දක්වා දිගටම මාතර පොලිස් ස්ථානයේ රඳවාගෙන පහරදීම්

සිදු කර ඇති බවට බාහිර පාර්ශවයන් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරමින් කරන තහවුරු කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, එසේ දිගින් දිගටම රඳවා ගැනීමක් සිදු නොකර බව සහ පහර දීමක් සිදු නොකරන ලද බවයි.

ඈ. වින්දිත පුද්ගලයා වරින් වර පොලිසියට කැඳවා විමසීම් කිරීම සම්බන්ධයෙන් පොලිස් තොරතුරු සටහන් පොත්වල සටහන් යොදා ඇති බවක් නිරීක්ෂණය නොවන බව පෙන්වා දීමෙන් පසු වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, එවැනි සටහන් තැබීමක් සිදු කර නොමැති බව පිළි ගන්නා බවත් වින්දිත පුද්ගලයා සම්බන්ධයෙන් අපරාධ ස්ථානයට අදාල සිසිටිවී දර්ශන ගෙනවිත් සංසන්දනය කිරීමත් සිදු කල බව පිළිගන්නා බවයි.

ඈ. පොලිස් විමර්ශනයකදී අදාල සියලුම තොරතුරු සටහන් කිරීම අනිවාර්යෙන් කල යුතු කාර්යක් මග හැරීම සම්බන්ධයෙන් කරුණු විමසීමේදී, වගඋත්තරකරු එම සටහන් දැමීමට නොහැකි වීම සම්බන්ධයෙන් පිළිගන්නා බවයි.

ඉ. ඉදිරිපත් කර ඇති උධෘත වලට අනුව වින්දිත පුද්ගලයා 2020.08.29 වන දින පැය 15:30 ට අත්අඩංගුවට ගෙන පැය 18:10 ට ඇප මත මුදාහැර ඇති අතර ප්‍රකාශ සටහන් කිරීම පැය 17:50 ට සිදු කර කඩිනමින් එනම් විනාඩි 20 ක් ඇතුලත පරීක්ෂණ අවසන් කිරීමට හේතුව පිළිබඳ කරුණු විමසීමේදී වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, දින කීපයක් වින්දිත පුද්ගලයා පොලිස් ස්ථානයට කැඳවා ප්‍රශ්න කර තිබූ බැවින් ඔහු ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමට තරම් ඒ වනවිට කරුණු තහවුරු වී නොතිබූ බැවින් හා අත්අඩංගුවට ගැනීම ප්‍රශ්න කිරීමට පමණක් වූ බැවින් නැවත දැනුම්දුන් විට ස්ථානයට පැමිණීමේ පදනම මත ඇප ලබා දීම සිදු කල බවයි.

ඊ. වින්දිත පුද්ගලයා ඒ අනුව නැවත කැඳවීමක් කලේද? යන්න පිළිබඳ කරුණු විමසීමේදී වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, එසේ කැඳවීමක් නොකල බවත් අනිකුත් විමර්ශන කටයුතු අතරතුර සිටියදී මසකට පමණ පසු අදාල වින්දිත පුද්ගලයා තමා හා තවත් පොලිස් නිළධාරින්ට විරුද්ධව විමර්ශනයට දැනුම් දීමක් කර ඇති බැවින් ඔවුන් එම ඉදිරි විමර්ශන කටයුතු සඳහා සහභාගී නොවූ බවයි.

උ. මෙම සිද්ධියට අපරාධයට වෙනත් අය අත්අඩංගුවට ගෙන තිබේද යන්න විමසීමේදී වගඋත්තරකරු දන්වා සිටියේ එක් පුද්ගලයකු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති බවයි.

<u>02 වන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක සමන්ත විජේසේකර මහතාගේ ප්‍රකාශ සහ පරීක්ෂණයේදී හෙළි වූ කරුණු</u>

2024.10.18 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයට සහභාගි වෙමින් පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ, මෙම සිදුවීම වන විට තමා මාලිම්බඩ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස රාජකාරි කරන ලද බවත් 2020.08.24 වන දින තෙලිජ්ජවිල රටබීම හල කඩා මුදල් රු. විසි එක් ලක්ෂ හතලිස් හත් දහස් එකසිය දහයක මුදලක් සොරකම් කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලද බවත් එම පැමිණිල්ල සටහන් කිරීමෙන් අනතුරුව ස්ථානාධිපති ප්‍ර.පො.ප. ජයවික්‍රම මහතා සමඟ මෙම අපරාධ ස්ථානයට ගොස් අපරාධ සම්බන්ධයෙන් මූලික විමර්ශනයත් පැවැත්වීමට එතුමාට සහය ලබාදුන් බවත් එසේම වින්දිත පුද්ගලයා විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවරා ඇති මූලික අයිතිවාසිකම් නඩුවේ වගඋත්තරකරුවෙකු ලෙස නම්කර ඇති බවට ප්‍රකාශ කර ඇත.

<u>පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුගෙන් කල වැඩිදුර කරුණු විමසීමේදී</u>

ආ. පැමිණිල්ල මඟින් වින්දිත පුද්ගලයා 2020.08.24 දින මාලිම්බඩ පොලිස් ස්ථානයේ ඔබ ඇතුලු කණ්ඩායමක් විසින් එදින උදේවරුවේ තෙලිජ්ජවිල වයින් ස්ටෝර්ස් එක අසලදී අත්අඩංගුවට ගෙන මාලිම්බඩ පොලිස් ස්ථානයට රැගෙන ගොස් 2020.08.25 දින රාත්‍රි දක්වා රඳවා තබාගෙන පහරදීම් සිදු කල බවට සඳහන් කර තිබීම සම්බන්ධයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, ස්ථානාධිපතිතුමාට මෙම අපරාධය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සඳහා සහය දැක්වූවා මිස පැමිණිල්ලේ දක්වා ඇති ආකාරයට පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමක් සිදු නොකර ඇති බවයි.

ආ. වින්දිත පුද්ගලයා හට පහර දීම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති චෝදනා සම්බන්ධයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, එසේ අත්අඩංගුවට ගැනීමක් පහර දීමක් සිදු නොකල බවත් මේ සම්බන්ධයෙන් වෙනත් යමක් කීමට නොමැති බවයි.

ඇ. වින්දිත පුද්ගලයා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු සන්තකයේ තිබූ ජංගම දුරකථනය සහ ආරක්ෂිත හිස්වැසුම (හෙල්මට්) 2020.08.27 දින මාතර පොලිසියට වගඋත්තරකරු විසින් ගෙනවිත් භාරදීම වින්දිත පුද්ගලයා දුටු බව පැමිණිල්ලේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, ඔහු කිසිදු සැකකරුවකු හෝ සැකකරුවෙකුට අයත් නඩු භාණ්ඩයක් හෝ සැකකරු දේපලක් ඔහු විසින් අත්අඩංගුවට ගෙන මාතර පොලිසිය වෙත කිසි අවස්ථාවක බාර නොදුන් බවයි.

<u>03 වන වගඋත්තරකරු වන ප්‍රධාන පොලිස් පරීක්ෂක චන්ද්‍රා ජයවික්‍රම මහතාගේ ප්‍රකාශ සහ පරීක්ෂණයේදී හෙළි වූ කරුණු</u>

2024.10.18 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයට සහභාගි වෙමින් පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ, මෙම සිද්ධිය සිදුවන කාලයේදී තමා මාලිම්බඩ පොලිසියේ

ස්ථානාධිපති ලෙස සේවය කල බවත් 2020.08.24 වන දින තෙලිජ්ජවිල නගරයේ රට බීමහලක් කඩා එහි තිබූ සේප්පුව තුල තිබූ රු. විසි හතර ලක්ෂ එකසිය හත්දහස් එකසිය දහයක් සොරකම් කිරීමක් සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලකට අනුව එහි මූලික විමර්ශන කටයුතු සිදු කර අපරාධ ස්ථානය නිරීක්ෂණය කර සටහන් යොදා ඇඟිලි සළකුණු රෙජිස්ට්‍රාර් නිළධාරීන් සහ නිල සුනඛයන් මෙන්ම සොකෝ (SOCO) නිලධාරින් කැඳවා මූලික විමර්ශන කටයුතු සිදු කරනු ලද බවත් ඒ අතරතුරදී මෙම අපරාධ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අපරාධ නඩු විධාන සංග්‍රහයේ 125 යටතේ මාතර මූලස්ථාන පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති වෙත පවරනු ලැබූ බවත් ඒ වනවිට මෙම අපරාධය සම්බන්ධයෙන් ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කිරීම තමා වෙත වූ වගකීමක් බැවින් 2020.08.26 වන දින මාතර ම/උ නඩු අංක 2522/20 යටතේ ගරු අධිකරණයට කරුණු වාර්තා කල බවත් ඉන් අනතුරුව මෙම අපරාධයට අදාළව සියලු විමර්ශන කටයුතු මාතර මූලස්ථාන පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් සිදු කරන ලැබූ බවත් එසේම මේ සම්බන්ධයෙන් වෙනත් යමක් කීමට නොමැති බවට ප්‍රකාශ කර ඇත.

<u>පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුගෙන් කල වැඩිදුර කරුණු විමසීමේදී</u>

අ. ජිනසිරි කරුණාසිංහ යන අය මාලිම්බඩ පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටියදී මෙම වින්දිත පුද්ගලයා වන දිල්ශාන් මධුශංක යන අය 2020.08.24 වන දින මාලිම්බඩ පොලිස් ස්ථානයට සවස 4.30 – 5.00 ත් අතර කාලයේදී බැරැක්කයට රැගෙනවිත් මාලිම්බඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති සහ අපරාධ අංශයේ ස්ථානාධිපති විජේසේකර යන නිලධාරින් විසින් සැකකරුගේ අත්දෙක පිටුපසට කර මාංචු දමා ඉතා අමානුෂික ලෙස පහරදුන් බව සියසින් දුටු බවට 2021.03.13 වන දින දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති බැවින් ඒ සම්බන්ධව කොමිෂන් සභාව විසින් විමසීමේදී ප්‍රකාශ කරන ලද්දේ, මෙම උ.පො.ප ජිනසිරි කරුණාසිංහ නිලධාරියා තමා ස්ථානාධිපතිව සිටින කාලය තුලදී මාලිම්බඩ පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති ලෙස රාජකාරි සිදු කරන ලද බවත් ඔහු එම කාලය තුල රථ වාහන රාජකාරි වල යෙදී සිටියදී වැලි ප්‍රවාහනය කරන ලද ට්‍රක් රථයකින් රු. විසි දහසක මුදලක් අල්ලස් ලෙස ලබාගත් බවට තොරතුරු අනාවරණය වීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමාට වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසු මෙම නිලධාරියා විනය හේතූන් මත මාලිම්බඩ පොලිස් ස්ථානයෙන් කඹුරුපිටිය පොලිස් ස්ථානය වෙත ස්ථාන මාරුවීමක් සිදු කර ඔහු සමීප අධීක්ෂණයකින් යුතුව රාජකාරිවල යොදන ලෙසට ස්ථාන මාරු කරන ලැබූ බවත් මෙම හේතුව නිසා මෙම උ.පො. පරීක්ෂකවරයා තමා සමඟ තරහෙන් සිටි බවත් එම ස්ථාන මාරුවීම ලබාදීමෙන් අනතුරුව 2021.03.13 වන දින තමා සමඟ ඇති අමනාපය පිරිමසා ගැනීමට එම දිවුරුම් ප්‍රකාශය ලබාදී ඇති බවත්ය.

ආ. ඉහත උ.පො.පරීක්ෂකවරයාට අමතරව වින්දිත පුද්ගලයා මාලිම්බඩ පොලිස් ස්ථානයේ රඳවා සිටි බවට ජනිත් මධුශංක, අවිශ්ක ශාන් සහ ජීවන් සමීර යන අයද ලබා දී ඇති

දිවුරුම් ප්‍රකාශ පිළිබඳ විමසීමේදී වගඋත්තරකරු ප්‍රකාශ කරන ලද්දේ, එම දිවුරුම් ප්‍රකාශයන්හි සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරන බවයි

**නිරීක්ෂණ**

01. පැමිණිලිකාරිය විසින් 2020.08.26 දින පොලිස්පතිතුමා අමතන ලද ලිපිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයට පිටපත් කරන ලද පිටපත සමඟ 2020.08.27 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයට පැමිණිලි කර ඇති අතර එම පැමිණිල්ට අනුව මාතර මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාලයේ පැමිණිලි ගොනුවේ 2020.08.27 දින ප.ව. 12:25 දින දරණ කාර්ය සටහන අනුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක විජේතුංග මහතා වෙතින් විමසීමක් කර ඇති අතර, පොලිස් පරීක්ෂක විජේතුංග මහතා විසින් "වින්දිත පුද්ගලයා අත්අඩංගුවට ගෙන ඇති බවත් මුදල් කොල්ල කෑමක් සම්බන්ධයෙන් ප්‍රකාශ සටහන් කර ගන්නා බවත් පහර දීමක් සිදු කර නොමැති බවට" ප්‍රකාශ කරන ලද බවට සටහනක් යොදා ඇති අතර, වින්දිත පුද්ගලයා බැලීමට අවස්ථාවක් සලසා දෙන ලෙස අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා වෙත ප්‍රාදේශිය කාර්යාලය විසින් වැඩිදුරටත් උපදෙස් ලබාදීමක් සිදු කර ඇත.

02. එදින පැමිණිලිකාරිය විසින් විධිමත් පැමිණිල්ලක් යොමු කර නොතිබූ බැවින්, මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2020.10.15 දාතමින් යුතු සිය ලිපිය මඟින් පැමිණිලිකාරිය වෙත දන්වා ඇත්තේ එම ලිපිය සමඟ ඉදිරිපත් කරන ආකෘති පත්‍රය පුරවා 2020.10.23 දිනට ප්‍රථම ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැති නම් මේ සබැඳිව උනන්දුවක් නොමැති බවට සලකා ගොනුවේ වැඩ කටයුතු අවසන් කිරීමට කටයුතු කරන බවයි.

03. ඒ අනුව පැමිණිලිකාරිය විසින් නියමිත ආකෘති පත්‍රයට අනුව සිය පැමිණිල්ල 2020.10.21 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයට ගොනු කර ඇත. ඉන්පසු එම පැමිණිල්ල 2020.10.26 දින ස්ථානාධිපති මාලිම්බඩ පොලිසිය සහ මාතර පොලිසිය වෙත යොමු කර සැකකරු අත්අඩංගුවට ගැනීමේ සිට අධිකරණයට ඉදිරිපත් කිරීම දක්වා තබන ලද සටහන් වල සහතික කරන ලද උධෘත ඉදිරිපත් කරන ලෙසද 2020.12.17 දිනැති ලිපිය මඟින් වගඋත්තරකාර පොලිස් නිලධාරීන්ට පැමිණිල්ල මඟින් නඟා ඇති චෝදනා සම්බන්ධයෙන් කිව යුතු කරුණු දිවුරුම් ප්‍රකාශ මඟින් ඉදිරිපත් කරන ලෙසද, 2020.12.23 දිනැති ලිපියක් පැමිණිලිකාරියට යොමු කරමින් සාක්ෂි ඉදිරිපත් කරන ලෙසට දන්වා ඇත.

04. 2021.11.24 දින ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්තුමිය විසින් වින්දිත පුද්ගලයා විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අංක SC FR 68/21 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම

වෙනුවෙන් වින්දිත පුද්ගලයා විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනුකර ඇති HRC/MT/245/20/N සම්බන්ධයෙන් විස්තර වාර්තාවක් ලබාදෙන ලෙසත් එකී මූලික අයිතිවාසිකම් පෙත්සම විවාදය සඳහා 2022.03.04 දින ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ කැඳවන බවත් වැඩිදුරටත් දන්වා එවා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශිය කාර්යාලය විසින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වාර්තාවක් 2021.12.23 දින ප්‍රධාන කාර්යාලය වෙත එවා ඇති අතර ඒ අනුව අදාල වාර්තාව HRC/Sec/SC/doc06 සහ 2022.01.21 දිනැති ලිපිය මඟින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කර ඇත. එසේම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශිය කාර්යාලය විසින් පැමිණිලිකාරිය වෙත අදාල සිද්ධිය සම්බන්ධයෙන් යටතේ මූලික අයිතිවාසිකම් නඩුකරයක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාග වන බැවින් ගොනුවේ වැඩ කටයුතු අවසන් කරන බවට දැනුම් දී ඇත.

05. එහෙත් නියමිත කාලසීමාවේදී (එනම් එකී උල්ලංඝනය සිදුවී දින 30 ක් ඇතුළත) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර නොමැති බවට ප්‍රකාශ කර SCFR 68/21 ශ්‍රේෂ්ඨාධිකරණ නඩුව 2024.02.16 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. ඉන් අනතුරුව වින්දිත පුද්ගලයා විසින් වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් තමාට සිදු කරන ලද අසාධාරණය සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කරන ලෙසට ඉල්ලා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීම හේතුවෙන් 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල ප්‍රකාර මෙම ගොනුවේ පරීක්ෂණ කටයුතු නැවත ආරම්භ කරමින් 2024.10.18 දින ප්‍රධාන කාර්යාලයේදී පළවන දෙවන සහ තුන්වන වගඋත්තරකාර පාර්ශවයන් වෙත සිතාසි යොමු කරමින් කොමිෂන් සභාවේ පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇත.

06. 2020.11.28 දිනැති මාතර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පී. ආර්. ධම්මික අමරසේන මහතාගේ අත්සනින් යුතු ලිපිය මඟින් පැමිණිල්ල සම්බන්ධව පහත විස්තර ඉදිරිපත් කර ඇත.

අ. 2020.08.23 වන දින රාත්‍රී කාලයේදී රට බීම සැලක් කඩා රුපියල් විසි එක් ලක්ෂ හතලිස් හත් දහස් එකසිය දහයක් සොරකම් කර ඇති බවට මාලිම්බඩ පොලිස් ස්ථානයට වාර්තා වී ඇති අපරාධයට අදාල විමර්ශන කටයුතු අ.න.වි.සං. 125 වගන්තිය ප්‍රකාරව සිදු කරන ලෙසට මාතර පොලිස් අධිකාරී (01) විසින් ස්වක්‍රීය පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක විජේතුංග ඇතුලු නිලධාරීන් කණ්ඩායමක් යොදවා විමර්ශන කටයුතු සිදු කරන ලෙසට ලබා දී තිබූ ලිඛිත නියෝගයක් අනුව සැකකරුවෙකු ලෙස වින්දිත පුද්ගලයා වන වලවේ දූරගේ දිල්ශාන් මධුශංක යන අය 2020.08.29 දින අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී

අපරාධය සම්බන්ධයෙන් සාර්ථක තොරතුරක් අනාවරණය නොවුන නිසා එදිනම සැකකරු ඇප මත මුදාහැර ඇති බවට සඳහන් කර ඇත.

ආ. සිය පොලිස් ස්ථානයේ සුළු අපරාධ සටහන් පොතින් උපුටා ගන්නා ලද සහතික කරන ලද පිටපතෙහි පහත සඳහන් කරුණු සඳහන් කර ඇත.

i. 2020.08.29 දින පැය 13:30 ට පොලිස් පරීක්ෂක විජේතුංගගේ නායකත්වයෙන් යුතු කණ්ඩායමක් වින්දිත පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට පොලිස් ස්ථානයෙන් පිටව ගොස් ඇත.

ii. 2020.08.29 දින පැය 17:30 ට නැවත පොලිස් ස්ථානය වෙත පැමිණි බවත් පැය 15:30 ට වින්දිත පුද්ගලයා තෙලිජ්ජවිල හන්දියේදී අත්අඩංගුවට ගත් බවත් පොලිස් ස්ථානයට රැගෙන විත් දීර්ඝ ලෙස ප්‍රශ්න කර ප්‍රකාශ සටහන් කර උප සේවයට භාර දුන් බවත් ප්‍රධාන දොරටුවේ රාජකාරි යෙදී සිටි පො. සැ. 32036 සරත් චන්ද්‍ර පරීක්ෂා කොට සාක්කු සටහන් පොත පැය 17:00 ට අත්සන් කල බවත් පොලිස් පරීක්ෂක විජේතුංග මහතා විසින් භාර දෙන ලද වින්දිත පුද්ගලයා උප සේවක පො. සැ. 57481 බන්දුසේන විසින් පරීක්ෂා කර බලා වින්දිත පුද්ගලයාගේ පිටතින් පෙනීමට තුවාල නොමැති බවත් දේපල කිසිවක් නොමැති බවත් ප්‍රධාන පොලිස් පරීක්ෂක තුමාගේ උපදෙස් ලැබෙන තෙක් සිර මැදිරියේ රඳවා තබන බවටත් සටහන් යොදා ඇත.

iii. 2020.08.29 දින පැය 18:10 පැයට වින්දිත පුද්ගලයා මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ නියෝග වලට අනුව පොලිස් පරීක්ෂක විජේතුංග මහතා විසින් ලබා දුන් උපදෙස් පරිදි නැවත දැනුම් දුන් විටදී පොලිස් ස්ථානයේ පෙනී සිටින කොන්දේසියට යටත්ව ඇප අයදුම් පතේ ඇපකරු ලෙස දෙවි නුවර, රාස්සන්දෙණිය, නුග ගහ කොරටුව පදිංචි ජා.හැ. අංක 913163087V හිමි සුරවීර හේවගේ නිපුන් විරාජිත් අය විසින් ඉදිරිපත් කර තිබූ බැඳුම්කරයට අත්සන් ලබාගෙන මුදාහරින ලද බව පො.සැ. 57481 බන්දුසේන විසින් සටහන් යොදා අත්සන් කර ඇත.

ඇ. මාතර පොලිස් ස්ථානයේදී දිල්ෂාන් මධුෂංක යන අයගෙන් ප්‍රකාශයක් 2020.08.29 වන දින ලබාගෙන එය, මාතර පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු පොතේ පිටු අංක 372 හි ඡේද අංක 111 යටතේ පැය 17:50 ට සටහන් කර ඇත. වින්දිත පුද්ගලයා වන දිල්ෂාන් මධුෂංක යන අයගේ සටහන් කරන ලද ප්‍රකාශය අනුව, දිල්ෂාන් මධුෂංක යන අය අපරාධය වාර්තා වූ දිනය එනම් 2020.08.24 දින උදෑසන ඔහුගේ මිතුරා වන මුදිත යන අය විසින් දුරකථන ඇමතුමක් ලබාදී බාර් එකට හොරු පැන ඇති බව දැනුම්දුන් පසු, එකී අපරාධ ස්ථානයට මෝටර් සයිකලයෙන් ගිය බවත් ඒවන විටත් මුදිත යන අය සහ බාර් එකේ වැඩකරන සේවකයින් දෙදෙනෙක් එහි සිට ඇති බවත්,

පොලිස් නිලධාරීන් පැමිණ බාර් එක ඇතුළත පරීක්ෂා කර ගිය බවත්, පසු තමා නැවත තමාගේ වෙළඳ ස්ථානයට පැමිණි පසු නැවත වරත් මුදිත යන අය විසින් ප්‍රකාශයක් ලබාදීම සඳහා පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට පණිවිඩයක් ලබාදුන් බැවින් එකී පණිවිඩය අනුව පොලිසියට ගිය බව සටහන් කර ඇත.

එහෙත් මාතර පොලිස් ස්ථානය විසින් ඉහත ප්‍රකාශය ලබාගැනීමේදී, හරස් ප්‍රශ්න විමසීමකින් තොරව වින්දියාගේ ප්‍රකාශය පමණක් සටහන් කර ගැනීම සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

07. 2021.02.03 දින පැමිණිලිකාරිය විසින් 2021.01.06 සහ 2021.02.03 දින වලදී අදාල දිවුරුම් ප්‍රකාශ සහ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත. එමඟින් පැමිණිල්ලේ සඳහන් කරුණු තහවුරු වන බව පෙනී යයි. ප්‍රතිකාර ලබා ගැනීම 2020.08.31 දින සිට ඉදිරියට මාතර දිස්ත්‍රික් සමුපකාර රෝහල වෙතින් ලබාගෙන ඇති අතර පසුව පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති මාතර දිස්ත්‍රික් රෝහලේ 2020.10.15 රෝග නිශ්චය පත (වෛද්‍ය 383 ඒ) අනුව වින්දිත පුද්ගලයා රජයේ රෝහල වෙත ප්‍රතිකාර සඳහා යොමු වී ඇති බව නිරීක්ෂණය වේ. එම රෝග නිශ්චිත පත අනුව මූලික පරීක්ෂණ වලින් අනතුරුව ප්‍රතිකාර ලබා දී ඇති බවත් පහර දීමක් හේතුවෙන් ශරීරයේ දකුණු කකුලේ මහපට (පලවෙනි) සහ වෙදැගිල්ල (හතරවෙනි) ඇඟිලිවල අස්ථීන්ට සිදුවූ තුවාල හා වම් කකුලේ මහපට (පලවෙනි) ඇඟිල්ලේ අස්ථියට සිදු වූ තුවාලයක් සම්බන්ධයෙන්ද pop (plaster of paris) දමා එය 2020.10.07 වන දින දක්වා තිබී ඇති බවට සටහන් යොදා ඇත. එසේම එම තුවාල ඒක්ස් රේ පරීක්ෂණයට අනුව සුව වී ඇති බවත් “no acute orthopedic pathology” යනුවෙන් සටහන් තබා 2020.10.28 දින විකලාංග සායනයට පැමිණෙන ලෙසත් දන්වා බෙහෙත් ලබා දී 2020.10.16 රෝහලෙන් බැහැර කර ඇති බව පෙනී යයි.

08. මාතර අධිකරණ වෛද්‍ය නිලධාරි වෛද්‍ය ශ්‍යාම් සමරවික්‍රම යන අය විසින් වින්දිත පුද්ගලයා 2020.10.16 දින 11:48 පැයට පරීක්ෂා කරන ලද බව හා තවදුරටත් සඳහන් කර ඇත්තේ, BHT 86498 දරණ ඇද ඉහපත් පත්‍රය අනුව වින්දිත තැනැත්තාගේ තුවාල කිසිවක් නොවූ බවත්ය. වින්දිත තැනැත්තා 2020.09.14 දින පුද්ගලික රෝහලකින් එක්ස් රේ ඡායාරූප ලබාගෙන ඇති බවත් එම එක්ස්-රේ පතට අනුව වම් කකුලේ මහපට (පලවෙනි) ඇඟිල්ලේ අස්ථි බිඳීමක් හා දකුණු කකුලේ මහපට (පලවෙනි) සුලගිල්ල (පස්වෙනි) සහ වෙදැගිල්ල (හතරවෙනි) ඇඟිලිවල අස්ථි බිඳීමක් නිරීක්ෂණය වූ බව සඳහන් කර ඇත. අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ මතය වී ඇත්තේ, බරපතල තුවාල කිසිවක් නොවන බවත්ය. අධිකරණ වෛද්‍යවරයා විසින් වින්දිත තැනැත්තාට තුවාල සිදු වූ ආකාරය පිළිබඳව කිසිවක් සඳහන් නොකර තුවාල පිළිබඳ එම අවස්ථාවේ අධිකරණ වෛද්‍ය නිළධාරි වෙත දැනුම් නොදී ඇති බව (He did not present his injuries to judicial medical officer) පමණක් සඳහන් කර ඇති බවද අදාළ වාර්තාව අනුව නිරීක්ෂණය විය. එබැවින් මේ සම්බන්ධයෙන් වැඩිදුර විමසා බැලීම

සඳහා අධිකරණ වෛද්‍ය ශ්‍යාම් සමරවික්‍රම මහතා 2026.05.05 දින කොමිෂන් සභාව වෙත කැඳවන ලදී.

09. එදින පරීක්ෂණයේදී, අධිකරණ වෛද්‍ය ශ්‍යාම් සමරවික්‍රම මහතා ප්‍රකාශ කර සිටියේ, ඩබ්. දිල්ශාන් මධුශංක යන අය 2020.10.16 දින තමා විසින් පරීක්ෂාවට ලක් කල බවත් එහිදී ඔහුට 2020.08.24 සහ 25 යන දිනවලදී මාතර සහ මාලිම්බඩ යන පොලිස් ස්ථානවල අපරාධ අංශයේ ස්ථානාධිපතිවරුන් විසින් පොලු වලින් සහ අතින් පයින් පහර දුන් බවට ප්‍රකාශ කල බව සඳහන් කර ඇත. එහෙත් තමා රෝගියා පරීක්ෂා කරන අවස්ථාව වනවිට බාහිර තුවාල කිසිවක් නොතිබූ බවත්, 2020.09.14 දින නිකුත් කරන ලද එක්ස්රේ පත පරීක්ෂා කිරීමෙන් අනතුරුව අධිකරණ වෛද්‍ය වාර්තාව සකස් කරන ලද බව ප්‍රකාශ කර ඇත.

10. කෙසේ වෙතත් අධිකරණ වෛද්‍ය නිළධාරී ඉහත සඳහන් කල ඒක්ස්-රේ පතට අනුව තුවාල සිදුවී ඇති බව නිරීක්ෂණය කල ද හා ඒවනවිටත් මාතර රජයේ රෝහල වෙතින් පැමිණිලිකරුගේ කකුලේ වූ තුවාල සඳහා pop (plaster of paris) දමා විකලාංග සායනය වෙත යොමු කර තිබුණද ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොගෙන තම මතය පළකරන අධිකරණ වෛද්‍ය වාර්තාවේ D කොටසෙහි no injuries යනුවෙන් සටහනක් යොදා ඇති අතර වැඩිදුර සටහනක් ලෙස “He did not present his injuries to judicial medical officer” යනුවෙන් සඳහන් කර ඇත. ඉහත වැඩිදුර සටහන පිළිබඳව විමසීමේදී රෝගියා තුවාල තිබූ අවස්ථාවේ අධිකරණ වෛද්‍යවරයෙකු ඉදිරියේ පෙනී සිට නොමැති වීම හේතුවෙන් එකී සටහන් යෙදූ බව ප්‍රකාශ කර ඇත.

11. අධිකරණ වෛද්‍ය නිළධාරිගේ කාර්යභාරය වනුයේ රෝගියකු විසින් වෛද්‍යවරයෙකුට තම තුවාල පිළිබඳ දැනුවත් කලාද නොකලාද යන්න නොවේ. ඔහු විසින් රෝගියා පරීක්ෂණයට භාජනය කරන අවස්ථාවේදී තිබූ තත්වයත් ඔහු ඉදිරියට පමුණුවා ඇති වෙනත් වාර්තා ආශ්‍රිතව තුවාල රෝගියා විසින් දෙන ලද ඉතිහාසය සමඟ කොතෙක් දුරට සමපාත වේද යන්න සලකා බලා තුවාලවල බරපතලතාවය පිළිබඳ තම මතය පළ කිරීමයි. නමුත් මෙම අධිකරණ වෛද්‍ය වාර්තාව ලබාදුන් වෛද්‍ය ශ්‍යාම් සමරවික්‍රම යන අය විසින් තුවාල වල බරපතලතාවය හෝ තුවාලය සිදුවී ඇති අයුරු පිළිබඳව නිසි වෛද්‍යමය අවධානය යොමුකර ඇති බවක් නිරීක්ෂණය නොවේ.

12. වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුශංක යන අය මාලිම්බඩ සහ මාතර පොලිස් ස්ථානයන්හි නිලධාරීන් විසින් පොලුවලින් සහ අතින් පයින් පහරදී ඇති බව අධිකරණ වෛද්‍ය නිලධාරී ශ්‍යාම් සමරවික්‍රම මහතා වෙතද 2020.10.16 දින ප්‍රකාශ කර ඇති බව එම නිලධාරියා කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයෙහිද සඳහන් වේ.

13. වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අයට මාතර පොලිස් ස්ථානයට ගෙන ගිය පසු අපරාධ අංශයේ ස්ථානාධිපති වන පළමුවන වගඋත්තරකරු විජේතුංග නිලධාරියා සහ එම අංශයේ නිලධාරීන් විසින් 2020.08.27 වන දින අපරාධ අංශයට මෙම අය රැගෙන ගොස් මේසයක් උඩ හාන්සිකරවා පොලු වලින් යටිපතුල් වලට පහරදුන් බවත්, නැවත නැගිට්ටවා කකුල් වලට සහ උර හිස් වලට පොලුවලින් පහරදුන් බවත්, එසේ පොලු තුනකින් දිගින් දිගටම පහරදීමේදී එක් පොල්ලක් දෙකට බිදී එහි ලී පතුරක් වම් කකුගේ දණහිසට පහලින් ඇනී තුවාල වූ බව ප්‍රකාශ කර ඇත. මෙවැනි තුවාලයක් සිදුවී තිබූ බවට අධිකරණ වෛද්‍යවරයා විසින් වාර්තා කර නොතිබුණ ද, පැමිණිලිකරු විසින් එය සනාථ කිරීම සඳහා එම තුවාලයේ ඡායාරූප කොමිෂන් සභාව වෙත යොමුකර තිබුණි. එම ඡායාරූප පරීක්ෂා කිරීමේදී අගතියටපත් පාර්ශවය ප්‍රකාශ කරන ආකාරයේ තුවාලයක් සිදුවී ඇති බවට නිරීක්ෂණය වේ. එබැවින් මෙකී පහරදීම සිදුවී ඇති බවට පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ හා ඡායාරූප නිරීක්ෂණයේදී පැහැදිලි වේ.

14. 2020.08.24 දින වින්දිත පුද්ගලයා වන දිල්ෂාන් මධුෂංක යන අය ඔහුගේ මිතුරෙකු වන මුදිත යන අය විසින් දුරකථන ඇමතුමක් ලබාදී, තමාට සොරකම සිදු වු තෙලිජ්ජවිල වයින් ස්ටෝර්ස් ආයතනය අසලට පැමිණෙන ලෙසට පොලිසිය විසින් දැනුම් දුන් බවට ප්‍රකාශ කළ බවත් එබැවින් තමා එම ස්ථානයට මිතුරකුගේ යතුරු පැදියකින් ගිය බවත් ප්‍රකාශ කර තිබේ. මෙම සිදුවීම සම්බන්ධයෙන් එදින දිල්ෂාන් මධුෂංක යන අයගේ ව්‍යාපාරික ස්ථානය වන ත්‍රී ස්ටාර් මොබයිල් ආයතනයේ සේවය කල හේවාගමගේ ජනිත් මදුශංක නැමැති මිතුරා සිට ඇති අතර, එම අය විසින් දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් 2020.08.24 දින දිල්ෂාන් මධුෂංක යන අයට මාලිම්බඩ පොලිස් ස්ථානයෙන් කැඳවීමක් ලැබුණු බවත් ඒ අනුව තමා ආයතනයේ නතර කර දිල්ෂාන් මධුෂංක පිටව ගිය බවට සාක්ෂි ලබාදී ඇත. එම සාක්ෂි අනුව 2020.08.24 වන දින දිල්ෂාන් මධුෂංක යන වින්දිත පාර්ශවය මාලිම්බඩ පොලිස් ස්ථානය වෙත ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

15. 2020.08.24 දින වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක මාලිම්බඩ පොලිසියට රැගෙන ගොස් දෑතට මාංචු දමා පොලිස් ස්ථානයේ පිටුපසට ගෙන ගොස් මාලිම්බඩ පොලිසියේ ස්ථානාධිපති ජයවික්‍රම මහතා සහ අපරාධ අංශයේ විජේසේකර නිලධාරීන් විසින් පහර දුන් බවට ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂියක් ලෙස දිවුරුම් ප්‍රකාශයක් යොමුකරනු ලබන එදින මාලිම්බඩ පොලිසියේම සේවයේ නියුතුව සිටි උප පොලිස් පරීක්ෂක ජිනසිරි කරුනාසිංහ යන නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත්තේ, 2020.08.24 වන දින පස්වරු 4-5 ත් අතර කාලයේදී ඉහත කී ජයවික්‍රම සහ විජේසේකර යන නිලධාරීන් විසින් වින්දිත පුද්ගලයාට මාලිම්බඩ පොලිස් ස්ථානයේ බැරැක්කයේදී අත්දෙක පිටුපසට කර මාංචු දමා ඉතා අමානුෂික අයුරින් පහර දුන් බව සියැසින් දුටු බවයි. තවද, රත්නායක මුදියන්සේලාගේ අවිශ්ක ප්‍රාන් යන අය විසින් ද දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් ප්‍රකාශ කර ඇත්තේ, දිල්ෂාන් මදුශංක යන

තමාගේ මිත්‍රයා 2020.08.25 වන දින මාලිම්බඩ පොලිස් ස්ථානය අත්අඩංගුවේ පසුවූ බවත් එහිදී තමා ඔහුව බැලීමට යන අවස්ථාවේදී මාලිම්බඩ පොලිසිය විසින් තමාගේ ඉහත කී මිතුරාට ඉතා අමානුෂික ලෙස පහර දෙන බව තමා දුටු බවයි. ඉහත දක්වන ලද දිවුරුම් ප්‍රකාශ දෙක අනුව මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අයට දෙවන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක විජේසේකර සහ තුන්වන වගඋත්තරකරුවන ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම යන නිලධාරීන් විසින් පහරදී ඇති බව තහවුරු වේ.

16. වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අයට දෙවන සහ තෙවන වගඋත්තරකරුවන් විසින් මාලිම්බඩ පොලිස් ස්ථානයේදී පහරදෙනු දුටු බවට දිවුරුම් ප්‍රකාශයක් ලබාදී ඇති මාලිම්බඩ පොලිස් ස්ථානයේ සේවයේ නියුතුව සිටි උ.පො. ප. ජිනසිරි නිලධාරියාගේ දිවුරුම් ප්‍රකාශය තුන්වන වගඋත්තරකරුවන ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම නිලධාරියා විසින් පිළිගත නොහැකි බව සඳහන් කර ඇත. ඊට හේතුව ලෙස උ.පො.ප. ජිනසිරි නිලධාරියා මෙම සිද්ධියට පරිබාහිර කරුණක් මත ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම නිලධාරියා සමඟ උරණව සිටි බැවින් ද්වේශ සහගතව තමාගෙන් පළිගැනීමේ චේතනාවෙන් අසත්‍ය දිවුරුම් ප්‍රකාශයක් ලබාදී ඇති බවට ප්‍රකාශ කර ඇත. එහෙත් 2020.08.24 දින වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය මාලිම්බඩ පොලිසියේ අත්අඩංගුවේ සිටි බවට ඔහුගේ පවුලේ ඥාතීන් සහ මිතුරන් විසින් ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශ සලකා බැලීමේදී උ. පො. ප. ජිනසිරි යන අය විසින් ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශය සඳහන් දින කාල වකවානු අනුව මනාව සැසඳෙන බැවින් තුන්වන වගඋත්තරකරුවන ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම නිලධාරියාගේ විරුද්ධත්වය තුළ පිළිගත හැකි හේතුවක් නොමැති බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

17. 2020.08.25 දින රාත්‍රි 9 – 9.30 ට පමණ මාලිම්බඩ පොලිසියේ සිට මාතර පොලිසියට රැගෙන ගිය බවට වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය විසින් ප්‍රකාශ කර ඇත. හේවාගමගේ ජනිත් මදුශංක යන අය විසින් ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශය අනුව හේවාගමගේ ජනිත් මදුශංක විසින් වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක බැලීමට මාලිම්බඩ පොලිස් ස්ථානයට රාත්‍රි 8 - 9 ත් අතර ට පමණ ගිය විටදී දිල්ෂාන් මධුෂංක යන අය මාතර පොලිසියට ගෙනගොස් ඇති බව හේවාගමගේ ජනිත් මදුශංක යන අයට දැනගන්නට ලැබුණු බව ප්‍රකාශ කර ඇත. ඉහත ප්‍රකාශයන්හි දක්වා ඇති වේලාව සම්බන්ධයෙන් සුලු වෙනස්කමක් පැවතිය ද 2020.08.25 දින රාත්‍රියේ මාතර පොලිස් ස්ථානය වෙත වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය රැගෙන ගොස් ඇති බව පෙනීයයි.

18. තවද, 2020.08.25 දින හේවාගමගේ ජනිත් මදුශංක යන අය මාලිම්බඩ පොලිස් ස්ථානයට ගිය පසු දෙවන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක විජේසේකර මහතා හේවාගමගේ ජනිත් මදුශංක යන අයට පරුෂ වචනයෙන් බැණ වැදී ඔහුගේ බඳපටිය සහ දුරකථනය ඉවත් කොට සිරිමැදිරියට දැමූ බවත්, 2020.08.26 දින සවස් යාමය වනතුරු පොලිස් සිරමැදිරියේ රඳවා

තබාගෙන පසුව පොලිස් ඇපමත නිදහස් කල බව ප්‍රකාශ කර ඇත. මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මාලිම්බඩ පොලිසිය වෙතින් යොමුකර ඇති සැකකරුවන් රඳවා තබාගැනීමේ ලේඛනය පරික්ෂා කිරීමේදී 2020.08.26 වන දින පැය 00.05 ට අපරාධයකට සැකපිට අත්අඩංගුවට ගෙන එදින සවස 2.30 ට ඇප මත නිදහස් කර ඇති බවට සටහන් කර ඇති බව අනාවරණය වේ. ඒ අනුව හේවාගමගේ ජනිත් මදුශංක යන අය 2025.08.25 වන දින රාත්‍රියේ මාලිම්බඩ පොලිස් ස්ථානය වෙත ගොස් ඇති බව සහ එදින එම අය අත්අඩංගුවට පත්ව ඇති බව තහවුරු වේ. තවද, රත්නායක මුදියංසේලාගේ අවිශ්ක ප්‍රාන් යන අය විසින් ද ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශයෙහි වින්දිත පාර්ශවය වන දිල්ශාන් මදුශංක යන අය 2020.08.25 වන දින මාලිම්බඩ පොලිස් ස්ථානය අත්අඩංගුවේ සිටිනු දුටු බවට සඳහන් කර ඇත. මෙම සාක්ෂි සියල්ල සලකා බැලීමේදී වින්දිත පාර්ශවය වන දිල්ශාන් මධුෂංක යන අය මාලිම්බඩ පොලිස් ස්ථානය විසින් අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන සිට ඇති බව පෙනීයයි.

19. වින්දිත පාර්ශවය වන දිල්ශාන් මධුෂංක යන අය 2020.08.25 වන දින මාතර පොලිසියේ අපරාධ අංශයට රැගෙන ඒමෙන් අනතුරුව පළමුවන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක විජේතුංග මහතා විසින් එම අයට පහරදුන් බව ප්‍රකාශ කර ඇත. 2020.08.27 වන දින පළමුවන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක විජේතුංග මහතා විසින් වින්දත පාර්ශවය වන දිල්ශාන් මධුෂංක යන අයට පහරදෙන ආකාරය ඇසින් දුටු බවට, හේවාගමගේ ජනිත් මදුශංක, අවිශ්ක, වලවේ දූරගේ මධූෂා කුමාරි, වලවේ දූරගේ ලංකා ලක්මාලි සහ පතිරණගේ රූපා (පැමිණිලිකාරිය) යන පස් දෙනා විසින් ම දිවුරුම් ප්‍රකාශ ලබාදෙමින් ප්‍රකාශ කර ඇත. එකී දිවුරුම් ප්‍රකාශ අනුව පළමුවන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක විජේතුංග යන අය විසින් වින්දිත පාර්ශවය වන දිල්ශාන් මධුෂංක යන අයට මාතර පොලිස් ස්ථානය තුළදී පහරදී ඇති බව පැහැදිලි වෙයි.

20. මෙම පැමිණිල්ල සනාථ කිරීම සඳහා පැමිණිල්ලේ සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ නවය තුළින් ම අගතියටපත් පාර්ශවය වන දිල්ශාන් මධුෂංක යන අය 2020.08.24 වන දින මාලිම්බඩ පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන රැඳවා තබාගෙන සිට ඇති බවත් එහෙත් කිසිදු ලේඛනයක අත්අඩංගුවට ගැනීම සටහන් නොකර 2020.08.25 වන දින රාත්‍රී 9.00 පමණ මාතර පොලිස් ස්ථානය වෙත භාරදී ඇති බවත් සනාථ වේ. ඒ අනුව මාලිම්බඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවන තුන්වන වගඋත්තරකරු වන ජයවික්‍රම යන අය සහ එම පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති දෙවන වගඋත්තරකරුවන විජේසේකර යන නිලධාරීන් දෙදෙනා ඇතුළු නිලධාරීන් විසින් අත්තනෝමතික ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

21. එමෙන්ම පැමිණිල්ල සනාථ කිරීම සඳහා පැමිණිල්ලේ සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ 9 ක් තුළින් 2020.08.25 වන දින රාත්‍රියේ මාලිම්ඩබ පොලිස් ස්ථානය විසින් වින්දිත

පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය මාතර පොලිස් ස්ථානය වෙත භාරදී ඇති බව නිරීක්ෂණය වේ. එහෙත් මාතර පොලිසියේ ලේඛනවල වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය අත්අඩංගුවට ගැනීම පිළිබඳව සටහනක් 2020.08.25 වන දින යොදා නොමැති අතර, එම අය 2020.08.29 පැය15:30 ට රටබීම වෙළඳ සැලක් බිඳ මුදල් සොරකම් කිරීමේ වරදට අත්අඩංගුවට ගත් බවට සුලු අපරාධ සටහන් පොතේ 177/224 යටතේ සටහන් යොදා ඇත. එසේ අත්අඩංගුවට ගැනීමෙන් පසු එදිනම පැය 17:50 ට ප්‍රකාශ සටහන් කළ බවට බල අපරාධ සටහන් පොතේ 372/111 යටතේ සටහන් කර ඇති අතර, එදිනම පැය 18:10 ට ඇප මත මුදාහැර ඇති බවට සුළු අපරාධ සටහන් පොතේ 178/225 යටතේ සටහන් යොදා ඇත. 372/111 යටතේ සටහන් කර ඇති දිල්ෂාන් මධුෂංක යන අයගේ ප්‍රකාශය නිරීක්ෂනය කිරීමේදී 2020.08.24 වන දින මාලිම්බඩ පොලිස් ස්ථානයට ඔහුගේ මිතුරෙකු වන මුදිත යන අයගේ දැනුම්දීම මත ප්‍රකාශයක් ලබාදීමට ගිය බව සඳහන් කර තිබුණ ද, මාතර පොලිස් ස්ථානය විසින් 2020.08.24 දින මාලිම්බඩ පොලිස් ස්ථානයට ගිය කාරණය සම්බන්ධයෙන් විමසීමක් සිදුකර නොමැත. තවද, තෙලිජ්ජවිල රට බීමහලේ සිදුවූ සොරකම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදුකිරීම සඳහා 2020.08.25 දිනැතිව මාතර පොලිස් අධිකාරී කාර්යාලය වෙතින් ලිඛිතව එම අපරාධය සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන කටයුතු සිදුකරන ලෙස මාතර පොලිසිය වෙත දැනුම්දී තිබියදී, දිල්ෂාන් මධුෂංක යන අයගෙන් 2020.08.29 දින ඉහත ප්‍රකාශය ලබාගැනීමේදී ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රශ්න කිරීමක් සිදුකර නොමැති බවද පෙනීයයි.

22. එමෙන්ම මාතර පොලිස් ස්ථානය විසින් අගතියටපත් පාර්ශවය 2020.08.25 වන දින මාලිම්ඩබ පොලිස් ස්ථානය මගින් භාරදුන් බවට සටහන් යොදා නොතිබුණ ද, පැමිණිලි පාර්ශවය විසින් ගොනුකර ඇති සාක්ෂි විමර්ශනය කිරීමේදී 2020.08.25 වන දින මාලිම්ඩබ පොලිස් ස්ථානය විසින් මාතර පොලිස් ස්ථානය වෙත භාරදී තිබියදී ඒ පිළිබඳව කිසිදු ලේඛනයකට ඇතුළත් නොකර අනීතිකව රඳවා තබාගනිමින් 2020.08.29 වන සිදුකරන ලද අත්අඩංගුවට ගැනීමක් සිදු කළ බවට ව්‍යාජ තොරතුරු ඇතුළත් කිරීමට මාතර පොලිස් ස්ථානය විසින් කටයුතු කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාවට පෙනීයයි. ඒ අනුව වින්දිත පාර්ශවය මාතර පොලිස් ස්ථානය විසින් ද පැය 24 අධික කාලයක් රඳවා තබාගැනීම තුළින් ද, එසේම පළමුවන වගඋත්තරකරු වන විජේතුංග යන අය විසින්, වින්දිත පාර්ශවය සම්බන්ධයෙන් නීතිය මගින් නියම කර ඇති ක්‍රියාපටිපාටියට පටහැනිව ක්‍රියාකරමින් මෙම අයගේ පෞද්ගලික නිදහස අන්‍යාකාරයකින් අහිමි කරමින් නීතිය ඉදිරියේ සර්ව සාධාරණත්ව අයිතිය වින්දිත තැනැත්තා සම්බන්ධව උල්ලංඝනය කිරීමට පළවන වගඋත්තරකාර විජේතුංග යන අය කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

23. තවද මෙකී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති තවත් සාක්ෂියක් ලෙස, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත 2020.08.27 දින මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් දැනුම්දී ඇති අතර, එදින මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මාතර පොලිස් ස්ථානය වෙත දුරකථන ඇමතුමක් ලබාදී එහිදී ලබාගත් විස්තර කාර්ය සටහන් වල ඇතුළත් කර ඇති ආකාරය මගින් හඳුනාගත හැක. 2020.08.27 වනදින පස්වරු 12:25 ට යොදන ලද කාර්ය සටහන්වල, "කාර්යාලයට මෙම සිද්ධිය පිළිබඳ පැමිණිල්ලක් ලැබීමෙන් පසු මාතර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක විජේතුංග මහතා වෙත දුරකථන ඇමතුමක් ලබාදෙන ලද අතර, එහිදී එම නිලධාරියා විසින් වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය අත්අඩංගුවට ගෙන ඇති බවත් මුදල් කොල්ල කෑමක් සම්බන්ධයෙන් ප්‍රකාශ සටහන් කර ගන්නා බවට සටහන් යොදා ඇත. එම නිලධාරියා විසින් ලබාදෙන ලද තොරතුර සම්බන්ධයෙන් පැමිණිලිකරු වෙත ලබාදුන් අතර, පැමිණිල්ලක් සිදු කිරීමට අවශ්‍ය නම් විධිමත් ආකාරයෙන් පැමිණිල්ලක් භාරදෙන ලෙස පැමිණිලිකරුවන් වෙත දැනුම්දුන් අතර, පොලිස් නිලධාරියා වෙත ද අදාළ සැකකරු බැලීම සඳහා පවුලේ ඥාතීන්ට අවස්ථාව ලබාදෙන ලෙසට උපදෙස් ලබාදෙන ලදි" යනුවෙන් සටහන් යොදා ඇත. මෙකී කාර්ය සටහන අනුව මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය 2020.08.27 වන දින වන විටත් මාතර පොලිස් ස්ථානයේ අත්අඩංගුවේ සිට ඇති බව නිරීක්ෂණය වේ. එහෙත් පළමුවන වගඋත්තරකරුවන විජේතුංග යන අය විසින් එදින හෝ මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ලේඛනවලට ඇතුළත් නොකර අත්තනෝමතික ආකාරයෙන් මෙම සැකකරු රඳවා තබාගැනීම සිදුකර ඇති අතර, පසුව 2020.08.29 දින පස්වරු 15:30 අත්අඩංගුවට ගත් බවට ව්‍යාජ සටහන් යෙදීම සිදුකර ඇති බවද පෙනීයයි.

24. මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2020.08.27 වන දින පළමුවන වගඋත්තරකරු වන විජේතුංග නිලධාරියාගෙන් වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද විමසීමට ලබාදී තිබූ පිළිතුර සම්බන්ධයෙන් විමසීමේදී ඊට පිළිතුරු ලෙස, වගඋත්තරකරු විසින් දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් ප්‍රකාශ කර ඇත්තේ, "දිල්ෂාන් මධුෂංක යන අය තෙලිජ්ජවිල රට බීමහලේ සේවකයින්ගේ නවාතැන් පොළට එදින රාත්‍රී කාලයේදී පැමිණි පුද්ගලයෙකු ලෙස ප්‍රශ්න කිරීම සඳහා තමා විසින් 2020.08.25 දිනෙන් පසුව අවස්ථා කිහිපයකදී මාතර පොලිස් ස්ථානය වෙත කැඳවීම සිදුකළ බවයි". මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී 2024.10.18 වන දින පවත්වන ලද පරීක්ෂණයේදී සිදුකරන ලද විමසීමට අනුව, ඉහත වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ, "2020.08.25 වන දිනෙන් පසුව 26, 27 සහ 28 යන දිනයන්හිදී වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය මාතර පොලිස් ස්ථානය වෙත කැඳවා තෙලිජ්ජවිල රට බීමහලේ සිදුවූ සොරකම සම්බන්ධයෙන් වරින් වර කරුණු විමසූ බවත්, එම අවස්ථාවන් වලදී

ඔහුගේ ඥාතීන් සහ දෙමාපියන් ද පැමිණි බවත් ප්‍රකාශ කර ඇති අතර, මෙම සැකකරු අත්අඩංගුවට ගැනීම 2020.08.29 වන දින සිදු කළ බවට ප්‍රකාශ කර ඇත.” ඉහත දක්වන ලද දිවුරුම් ප්‍රකාශය මගින් ලබාදී ඇති ප්‍රකාශය හා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පරීක්ෂණ අවස්ථාවේදී ලබාදී ඇති ප්‍රකාශය විමර්ශනය කිරීමේදී එකී සියලුම කරුණු දැක්වීම් අසත්‍යක් බව පෙනීයන අතර, වගඋත්තකරු ප්‍රකාශ කරන ආකාරයට දිල්ෂාන් මධුශංක යන අය මාතර පොලිස් ස්ථානයට ගෙන්වා කරුණු විමසීමක් සිදුකළ බවට තහවුරු කරන කිසිදු ආකාරයක ලේඛනයක් 2024.10.18 දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට පළමුවන වගඋත්තරකරුවන විජේතුංග යන අය අපොහොසත් වී ඇත. මාතර පොලිස් ස්ථානය විසින් තෙලිජ්ජවිල රට බීමහලේ සිදුවූ රු. 21,47110/- ගණනක සොරකම සම්බන්ධයෙන් දින ගණනාවක් කැඳවා ප්‍රශ්න කිරීම සිදුකරනු ලැබුවේ නම් ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් සටහන් කර නොගැනීම මෙම වගඋත්තරකරු විසින් රාජකාරිය පැහැරහැරීම එනම් යම් රාජකාරී ලිපි ලේඛනයක හෝ පොතක යම් අවශ්‍ය සටහනක් නොලියා හැරීමක් සිදුකර ඇති බව සනාථ වේ.

25. ඉහත නිරීක්ෂිත කරුණු අනුව මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය මාතර පොලිස් ස්ථානයේ අනීතික ලෙස රඳවා තබා ගැනීම සහ එම පොලිස් ස්ථානයේදී පහරදීම සඳහා වූ චෝදනා සම්බන්ධයෙන් මාතර පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා සිය වගකීම් වලින් බැහැරවිය නොහැකි බව නිරීක්ෂණය කරන බැවින් පැමිණිලිගත සිද්ධියට අදාල කාලසීමාවේ මාතර මූලස්ථාන පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ තොරතුරු කොමිෂන් සභාවේ 2025.06.26 දිනැති ලිපිය මගින් විමසන ලද අතර එම ලිපියට පිළිතුරු ලෙස මාතර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති (පාලන) එස්. යූ. ජයසිංහ මහතාගේ අංක 2528/2025 සහ 2025.06.30 දිනැතිව ලිපියක් කොමිෂන් සභාවට යොමු කරමින් දන්වා ඇත්තේ, පැමිණිලිගත සිද්ධියට අදාල කාලසීමාවේ මාතර මූලස්ථාන පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා ලෙස කටයුතු කරන ලද ප්‍රධාන පොලිස් පරීක්ෂක පී. ආර්. ධම්මික අමරසේන මහතා 2020.08.24 වන දින සිට දින 04 ක් හිලව් නිවාඩු ලබා පිටව ගොස් 2020.08.28 දින ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවි නඩු අංක 86385 දරණ නඩුව සඳහාද පෙනී සිට 2020.08.29 දින රාජකාරියට වාර්තාකර ඇති බවයි. ඒ අනුව ප්‍රධාන පොලිස් පරීක්ෂක පී. ආර්. ධම්මික අමරසේන මහතා පැමිණිලිගත සිද්ධියට අදාල කාලසීමාව තුල නිවාඩු ලබා සිටීම සහ අධිකරණ කටයුතු වලට පෙනී සිටීම හේතුවෙන් ස්ථානයේ බැහැරව සිටි බව නිරීක්ෂණය වීම මත ස්ථානාධිපති අධීක්ෂණ වගකීම සම්බන්ධව වගකීමෙන් බැහැර කරනු ලැබේ.

26. මාතර පොලිස් ස්ථානාධිපතිගේ 2025.06.30 දිනැති ලිපිය මගින් එම කාලය තුළ ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක රාජකාරී ආවරණය ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණසිංහ නිළධාරියා සිදු කර ඇති බව දන්වා ඇත. මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන දිල්ෂාන්

මධුෂංක යන අය මාතර පොලිස් ස්ථානයේ අනීතික ලෙස රඳවා තබා ගැනීම සහ එම පොලිස් ස්ථානයේදී පහරදීම සඳහා වූ චෝදනා සම්බන්ධයෙන් එම කාලසීමාවේ මාතර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක රාජකාරී ආවරණය කරන ලද ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණසිංහ මහතාට සිය ආවරණ රාජකාරීවලින් බැහැරවිය නොහැකි බව නිරීක්ෂණය වන අතර, කෙසේනමුත් මේවන විට ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණසිංහ මහතා විශ්‍රාම ලබා ඇති බැවින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවීමක් සිදුනොකළද, එම නිලධාරියා විසින් සිය රාජකාරී ඉටුකිරීමේදී අපකීර්තිදායක හැසිරීමක් පෙන්වන බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂවරයාගේ අංක D/SIU/OW/1557/2026 සහ 2026.02.26 දිනැති වාර්තාව මඟින් සිද්ධියට අදාල කාලසීමාවේ මාතර මූලස්ථාන පොලිස් ස්ථානයේ රාජකාරී ආවරණය කරන ලද ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණසිංහ නිලධාරියාට අවවාද පත්‍රයක් ලබා දීමට නිර්දේශ කර විමර්ශනයේ අවසන් වාර්තාව 2023.03.20 වන දින එවකට අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩී. එස්. වික්‍රමසිංහ මහතා විසින් පොලිස්පතිවරයා වෙත යොමු කර ඇති බව නිරීක්ෂණය වේ.

27. මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය විසින් 2020.08.29 දිනට පසු පොලිස් අධිකාරී කාර්යාලය වෙත ගොස් පස්වන වගඋත්තරකරුවන පොලිස් අධිකාරී එච්. කේ. එස්. විජයගුණවර්ධන මහතා හමුවී ඔහුට මාලිම්බඩ පොලිස් ස්ථානයෙන් හා මාතර පොලිස් ස්ථානයෙන් සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් පැමිණිලිකර ඇති බව නිරීක්ෂණය වේ. ඒවන විටත්, තෙලිජ්ජවිල රට බීමහලේ සිදුවූ සොරකම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදුකිරීම සඳහා 2020.08.25 දිනැතිව ලිපියක් යොමුකරමින්, එම නිලධාරියා විසින්ම "මාලිම්බඩ පොලිස් ස්ථානය විසින් නිසි විමර්ශනයක් සිදුනොකරන බව නිරීක්ෂණය වන බැවින් එම අපරාධය සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන කටයුතු සිදුකරන ලෙස මාතර පොලිසිය වෙත භාරදී ඇත." යනුවෙන් එකී ලිපියේ සඳහන් කොට ඇත. මෙම සිදුවීම් මාලාව සම්බන්ධයෙන් පස්වන වගඋත්තරකරුවන පොලිස් අධිකාරී එච්. කේ. එස්. විජයගුණවර්ධන මහතා දැනුවත්ව සිට ඇති බව නිරීක්ෂණය වන අතර, එවැනි වාතාරණයක් තුළ අසාධාරණයට ලක්වූ වින්දිත පුද්ගලයා සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගැනීමට සහ වින්දිත පුද්ගලයා ආරක්ෂා කිරීමට කටයුතු කිරීමේ හැකියාව තිබියදී ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගෙන කටයුතු කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. කෙසේනමුත් මේවන විට පස්වන වගඋත්තරකරුවන පොලිස් අධිකාරී එච්. කේ. එස්. විජයගුණවර්ධන මහතා විශ්‍රාම ලබා ඇති බැවින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවීමක් සිදුනොකළද, එම නිලධාරියා විසින් සිය රාජකාරී ඉටුකිරීමේදී අපකීර්තිදායක හැසිරීමක් පෙන්වන බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

28. 2024.10.18 වන දින කොමිෂන් සභාවේදී පැවැති පරීක්ෂණයේදී වින්දිත පුද්ගලයා විසින් පොලිස්පතිතුමාට ඉදිරිපත් කරන ලද පෙත්සමට අනුව කොළඹ පොලිස් විශේෂ විමර්ශන

ඒකකය විසින් පරීක්ෂණයක් සිදු කර ඇති බව අනාවරණය වූ බැවින් එම විමර්ශන වාර්තා කොමිෂන් සභාවේ 2025.01.03 දිනැති ලිපිය මඟින් කැඳවන ලදී. එකී පරීක්ෂණය තුළින්, පළවන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක විජේතුංග හට සහ දෙවන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක විජේසේකර හට දකුණු පළාත් නියෝජ්‍ය පොලිස්පති රොහාන් ජේ සිල්වා මහතා විසින් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇති බවත්, තුන් වන වගඋත්තරකාර ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම මහතා හට මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ පොලිස්පති චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇති බවත් අනාවරණය විය.

29. තවද අධ්‍යක්ෂක විශේෂ විමර්ශන ඒකකය මඟින් අධ්‍යක්ෂක නීති කොට්ඨාශය මඟින් ගරු නීතිපතිතුමා වෙත මෙම සිද්ධිය සම්බන්ධයෙන් සිදු කල පරීක්ෂණයෙන් විමර්ශන වාර්තාව ASP (III) /SIU /OW/ 31/2023 (98-21)-U8 හා 2023.02.20 දිනැතිව ඉදිරිපත් කරමින් මාලිම්බඩ පොලිස් ස්ථානය සහ මාතර පොලිස් ස්ථානයේ නිලධාරීන් සම්බන්ධයෙන් 1994 අංක 22 දරන වධදීමට සහ අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීම හෝ දඬුවම් වලට එරෙහි වූ සම්මුති පනත යටත් දැක්වෙන වරදක් හෝ වරදවල් සිදු කර ඇත්නම් ඒ සම්බන්ධයෙන් නීති මඟින් ක්‍රියා කිරීම සඳහා උපදෙස් ඉල්ලුම් කර ඇති අතර ඒ අනුව වගඋත්තරකරුවන් සිව් දෙනෙකු විෂයේ මාතර මහාධිකරණයේ නඩු පවරා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවද නිරීක්ෂණය වේ. තවද, උක්ත පනත ප්‍රකාරව නීතිපතිවරයා විසින් මාතර මහාධිකරණ නඩු අංක 269/2024 හා 269/2024A යටතේ 2025.01.27 වන දින අධිචෝදනා ගොනු කර මහාධිකරණයේ නඩු කටයුතු ආරම්භ වීම හේතුවෙන් පළවන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක විජේතුංග, දෙවන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක විජේසේකර සහ තුන් වන වගඋත්තරකාර ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම යන නිලධාරීන් 2025.02.03 දින වැඩ තහනම් කර ඇති බවත් මෙතෙක් සේවයේ පිහිටුවා නොමැති බවත් විශේෂ විමර්ශන අංශයේ අධ්‍යක්ෂවරයාගේ අංක D/SIU/OW/1557/2026 හා 2026.02.26 දිනැති ලිපිය මඟින් වැඩිදුරටත් අනාවරණය වේ.

30. එසේම ඉහත නඩුවට අදාලව පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය 2025.05.08 වන දින මාතර මහාධිකරණයේදී පැවැත්වූ බවත් එහිදී රජයේ අධිනීතිඥවරයා විසින් ගොනු කරන ලද අධිචෝදනා පත්‍ර නැවත නඩු පැවරීමේ පදනම මත ඉල්ලා අස්කර ගෙන නැවත නීතිපතිවරයාගේ අංක AGT/01/2023 සහ 2025.05.15 දිනැති නියෝගය පරිදි නැවත පෙර අධිචෝදනා ගොනු කරන ලද නිලධාරීන් සිව් දෙනා 2021 අංක 15 දරන (සංශෝධිත) පනතේ සංශෝධිත 1994 අංක 22 දරන වධදීමට හා අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමකට හෝ දඬුවම්වලට එරෙහි වූ සම්මුතිය පනතේහි 2(1) වගන්තිය සමඟ කියවිය යුතු 2(4) වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකර ඇති බවට සැකකර අත්අඩංගුවට ගෙන මාතර මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 2908/25 යටතේ අධිකරණයට ඉදිරිපත් කර

ඇති බවත් ඒ අනුව මෙකී මාතර මහේස්ත්‍රාත් නඩුවේ සැකකරුවන් වූ නිලධාරී සිව් දෙනාට එරෙහිව නීතිපතිවරයා විසින් මාතර මහාධිකරණයේ නඩු අංක 236/2025 සහ 236/2025A යටතේ අධි චෝදනා ගොනුකර ඇති බවත් විශේෂ විමර්ශන අංශයේ අධ්‍යක්ෂවරයාගේ 2026.02.26 දිනැති ලිපිය මඟින් වැඩිදුරටත් අනාවරණය විය.

**නිගමනය**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කරන ලද සියලුම සාක්ෂි විමර්ශනය කිරීමෙන් අනතුරුව, කොළඹ පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් සිදුකරන ලද පරීක්ෂණ මගින් අනාවරණය කර ගන්නා ලද කරුණු පිළිබඳව ද අවධානය යොමුකර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත නිගමන වලට එළඹෙන ලදි.

මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය මාලිම්බඩ පොලිස් ස්ථානය විසින් 2020.08.24 වන දින අත්අඩංගුවට ගැනීම, පොලිස් ස්ථානයේ ලේඛනවල ඇතුළත් නොකර සිය රාජකාරිය පැහැරහරිමින් 2020.08.25 වන දින සිය අත්තනෝමතිකව මාතර පොලිස් ස්ථානය වෙත භාරදීම සහ මෙම අය අත්අඩංගුවට ගෙන අමානුෂික ආකාරයෙන් පහරදීම, වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු නොකිරීම, පොලිස් අත්අඩංගුවේ සිටියදී නිසි ආරක්ෂාව ලබානොදීම යන චෝදනා සම්බන්ධයෙන් දෙවන වගඋත්තරකරුවන පොලිස් පරීක්ෂක විජේසේකර යන අය වගකිව යුතු බවට ද නිගමනය කරනු ලැබේ.

එසේම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය මාලිම්බඩ පොලිස් ස්ථානය විසින් 2020.08.24 වන දින අත්අඩංගුවට ගැනීම, පොලිස් ස්ථානයේ ලේඛනවල ඇතුළත් නොකර සිය රාජකාරිය පැහැරහරිමින් 2020.08.25 වන දින සිය අත්තනෝමතිකව මාතර පොලිස් ස්ථානය වෙත භාරදීම සහ මෙම අය අත්අඩංගුවට ගෙන අමානුෂික ආකාරයෙන් පහරදීම, වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු නොකිරීම, පොලිස් අත්අඩංගුවේ සිටියදී නිසි ආරක්ෂාව ලබානොදීම යන චෝදනා සම්බන්ධයෙන් මෙන්ම පොලිස් ස්ථානයේ අධීක්ෂණ රාජකාරි නිසි ලෙස ඉටු නොකිරීම සම්බන්ධයෙන්ද තුන්වන වගඋත්තරකරුවන ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම යන අය වගකිව යුතු බවට නිගමනය කරනු ලැබේ.

තවද, 2020.08.25 වන දින මාතර පොලිස් ස්ථානයට රැගෙන එන ලද වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය මාතර පොලිස් ස්ථානයේ කිසිදු ලේඛනයක ඇතුළත් කිරීමකින් තොරව සිය රාජකාරිය පැහැරහරිමින් 2020.08.29 වන දින වන තෙක් අත්තනෝමතික ආකාරයෙන් රඳවා තබාගැනීම, මාතර පොලිස් ස්ථානය තුළදී අමානුෂික ආකාරයෙන් මෙම අයට පහරදීම සහ 2020.08.29 වන අත්අඩංගුවට ගත් බවට ව්‍යාජ කරුණු වාර්තා කිරීම, පොලිස් අත්අඩංගුවේ සිටියදී නිසි ආරක්ෂාව ලබානොදීම සහ පොලිස් අත්අඩංගුවේ සිටියදී වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු

නොකිරීම සහ ප්‍රතිකාර ලබාගැනීම වැළැක්වීම යන චෝදනා සම්බන්ධයෙන් පළමුවන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක විජේතුංග යන අය වගකිව යුතු බවට ද නිගමනය කරනු ලැබේ.

තවද, වින්දිත පාර්ශවය වන දිල්ෂාන් මධුෂංක යන අය පරීක්ෂා කිරීමේදී අධිකරණ වෛද්‍ය ශ්‍යාම් සමරවික්‍රම යන අය සිය වෘත්තීය රාජකාරී නිසි වෛද්‍ය වෘත්තීමය ආකාරයෙන් සිදු කර ඇති ද යන්න ගැටළු සහගත වේ.

ඒ අනුව පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන වලවේ ධූරගේ දිල්ෂාන් මධුෂංක යන අය සම්බන්ධයෙන්, **1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් ප්‍රකාශිත "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම ද, 12 (1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම ද, 13 (1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති " නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුතුතේය. යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද, ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය" යන මූලක අයිතිවාසිකම ද, 13 (2) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "අත්අඩංගුවෙහි තබාගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්වයකාරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත්අඩංගුවෙහි තබාගැනීම හෝ රඳවා තබාගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේය." යන මූලික අයිතිවාසිකම ද, පළමුවන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක විජේතුංග, දෙවන වගඋත්තරකරුවන පොලිස් පරීක්ෂක විජේසේකර, තුන්වන වගඋත්තරකරුවන ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම යන අය විසින් උල්ලංඝනය කර ඇති බව ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.**

එකී නිගමනය ප්‍රකාරව මෙම වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් පහත නිර්දේශ නිකුත් කරනු ලැබේ.

**නිර්දේශ :**

1. පළමුවන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක විජේතුංග යන අය විසින් වින්දිත පාර්ශවයවන දිල්ෂාන් මධුෂංක යන අය අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සටහන් නොකිරීම, පොලිස් අත්අඩංගුවේ

සිටියදී පහරදීම, පොලිස් අත්අඩංගුවේ සිටියදී වෛද්‍ය ප්‍රතිකාර වෙත යොමු නොකිරීම සහ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම වැළැක්වීම මඟින් දිල්ෂාන් මධුෂංක යන අයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12(1), 13(1) සහ 13(2) යන වන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් එම අය වෙත රු. 100,000/- ක මුදලක් ගෙවිය යුතුය.

2. දෙවන වගඋත්තරකරුවන පොලිස් පරීක්ෂක විජේසේකර යන අය විසින් වින්දිත පාර්ශවයවන දිල්ෂාන් මධුෂංක යන අය අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සටහන් නොකිරීම, පොලිස් අත්අඩංගුවේ සිටියදී පහරදීම, පොලිස් අත්අඩංගුවේ සිටියදී වෛද්‍ය ප්‍රතිකාර වෙත යොමු නොකිරීම මඟින් දිල්ෂාන් මධුෂංක යන අයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12(1), 13(1) සහ 13(2) යන වන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් එම අය වෙත රු. 100,000/- ක මුදලක් ගෙවිය යුතුය.

3. තුන්වන වගඋත්තරකරුවන ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම වින්දිත පාර්ශවයවන දිල්ෂාන් මධුෂංක යන අය අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සටහන් නොකිරීම, පොලිස් අත්අඩංගුවේ සිටියදී පහරදීම, පොලිස් අත්අඩංගුවේ සිටියදී වෛද්‍ය ප්‍රතිකාර වෙත යොමු නොකිරීම සහ පොලිස් ස්ථානයේ අධීක්ෂණ රාජකාරී නිසි ලෙස ඉටු නොකිරීම මඟින් දිල්ෂාන් මධුෂංක යන අයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12(1), 13(1) සහ 13(2) යන වන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් එම අය වෙත රු. 100,000/- ක මුදලක් ගෙවිය යුතුය.

**පොලිස්පතිතුමා විසින්,**

4. පළමුවන, දෙවන, තුන්වන වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වා විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනය ප්‍රකාරව ඉදිරිපත් කරන ලද නිර්දේශ ඉහතින් දක්වා ඇත. මේවන විටත් මෙම වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් පොලිස් විශේෂ විමර්ශන ඒකකය මඟින් පරීක්ෂණයක් පවත්වා අදාළ පරීක්ෂණ වාර්තාව, 1994 අංක 22 දරණ වධ දීමට හා අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමකට හෝ දඬුවම් වලට එරෙහිව වූ සම්මුති පනත ප්‍රකාරව ඉහත වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නීතිපතිතුමා වෙත යොමුකර ඇති බවත්, නීතිපතිතුමා විසින් ඉහත පනත යටතේ වගඋත්තරකරුවන් තිදෙනාට නඩු පවරා ඇති බවත්, ඒ අනුව ඉහත වගඋත්තරකරුවන් තිදෙනාගේ වැඩ තහනම් කර ඇති බවත් වාර්තා කර ඇත.

2026. ..01. 30.......... වන දිනට පෙර පළමු, දෙවන හා තෙවන වගඋත්තරකරුවන් විසින් වින්දිත පාර්ශවය සඳහා අදාළ මුදල ගෙවා අවසන් කළ යුතු අතර, පොලිස්පතිතුමා විසින් ඉහත නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වේ.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීමට.

03. පොලිස්පති,
පොලිස් මූලස්ථානය, කොළඹ 01. - ඉහත නිර්දේශ ප්‍රකාරව පි.ගැ.

04. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07. - අ.ක.ස.

05. අධ්‍යක්ෂ,
මානව හිමිකම් කොට්ඨාශය, නො.78, 5 වන මහළ,
මුක්තාර් ප්ලාසා ගොඩනැගිල්ල, ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14. - අ.ක.ස.

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් අගතියටපත් අය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.